# භක්ති ප්‍රබෝධනය

එකසිය විසිපස්වසරක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2024 නොවැම්බර් - දෙසැම්බර් | 125 වන කාණ්ඩය - 06 කලාපය | පිටු 32 | DOP/NEWS/01/2024



## කඳුළයි සිනහවයි

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල සඟරාව

ආරම්භය 1899

# මල් රැගෙන ඒවි මා සුහදයන්

ගී පද - බන්දුල නානායක්කාරවසම්
තනු නිර්මාණය සහ ගායනය -
ආචාර්ය රෝහණ වීරසිංහ

**මල් රැගෙන ඒවි මා සුහදයන්**
**මෙලොව හැර ගිය දිනේ මා**
**එ මල් නොපෙනේවි මට**
**නොව දැනේ ඒ සුවඳ**
**ඒ නිසා ...**
**මල් රැගෙන එන්න මා ජීවත්ව සිටියදී**
**කඳුළු වගුරා වි මා නෑසියන්**
**මෙලොව හැර, ගිය දිනේ මා**
**කඳුළු නොපෙනේය මට**
**වැසුණු මා නෙතු යුගට**
**ඒ නිසා ...**
**දුක බෙදා ගන්න මා ජීවත්ව සිටියදී**
**මිතු කැලන් පැමිණේවි රොද බැඳන්**
**මෙලොව හැර ගිය දිනේ මා**
**මුහුණු නොපෙනේවි මට**
**නිහඬ මා දෙණ අසල**
**ඒ නිසා ...**
**හමුවන්න, මුසු වන්න ජීවත්ව සිටියදී**
**කිත් යසස් ගැය වේවි මා නමින්**
**මෙලොව හැර ගිය දිනේ මා**
**සමා නොලැබේය මට**
**කළ වැරදි යයි සැඟව**
**ඒ නිසා ...**
**පෙන්වන්න හරි වැරදි ජීවත්ව සිටියදී**



මේ ගීතය ජීවිත ගමනේ අවසානය වන අවමංගල්‍යයක ඇතැම් තැන්වල සිද්ධ වන ක්‍රියා කීපයක් තාත්ත්විකව ඉදිරිපත් කරමින් කෙනකුගේ මරණයට පෙර සිදුවිය යුතු සත්‍යය ක්‍රියා කුමක්ද යන්න අසන්නන්ට අවබෝධ කර දීමට ගත් ඉතා සාර්ථක උත්සාහයක් බව ගේය පද දෙස බලන්නකුට පැහැදිලිය.

"මල් රැගෙන ඒවි මා සුහදයන්" මීට වසර කීපයකට පෙර විදේශීය රටක ජීවත් වන කාන්තාවක මට දුරකථනයෙන් පැවසුවේ ඇයට තම මවගේ අවමංගල්‍යයට සහභාගි වන්නට අවස්ථාවක් නොමැති නිසා රු. 250000 ක මුදලක් පවුලේ කෙනකුට එවමින් පවසා ඇත්තේ මිනිය වටේටම අමු මල් තබන ලෙසය. කළ යුතුදේ ගීතයේ සඳහන් වන අතර තවත් පියවරක් වන්නේ දිළිඳු පවුලක අවශ්‍යතාවකට ඒ මුදල මිය ගිය මවගේ නමින් යොමු කරන්නට සිතුණා නම් එය මොන තරම් වඩා ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් වන්නට තිබුණා නොවේද?

ගීත රචකයා පාඨකයන්ට මතක් කරන්නේ කොතරම් කඳුළු වැගුරුවත්, රොද බැඳන් මළ ගෙදරට මිතුරන් පැමිණුණත්, මළ ගිය තැනත්තා හෝ තැනත්තිය වෙනුවෙන් ගුණ වර්ණනා කරමින් ගී ගායනා කළත්, ඉන් මිය ගිය පුද්ගලයාට පලක් නැත. කළ යුත්තේ, හමුවන්න, කථා බහ කරන්න, පුද්ගලයා ජීවත්ව සිටියදී යන්නය. කළ වැරදි පෙන්වා නොදෙමින් මරණයට පසු යසස් ගී ගැයූවත් ඉන් පලක් නැත. ජීවත් වී සිටින විට කෙනෙකුගේ වැරදි පෙන්වා දීම මොන තරම් අර්ථාන්විතද යන්න ගීත රචකයා පෙන්වා දෙයි. කෙනකුගේ මරණයට පෙර අපගේ යුතුකම් සහ ආදරය දයාව පෙන්වීමට අවශ්‍ය ආලෝකය මේ ගීතය හරහා ලබත්වා.

**එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා**

# භක්ති ප්‍රබෝධනය

**2024 නොවැම්බර් - දෙසැම්බර්**


**ප්‍රකාශනය**

නිර්මල මරිය නිකාය

**භාරකරු**

අතිගරු රොෂාන් සිල්වා නි. ම. නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

**සංස්කාරක**

ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

**සංස්කරණ සහාය**

රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
පිලීෂන් අබයකෝන්

**කවරය නිර්මාණය**

අචල රූපසිංහ

**පරිගණක පිටු සැකසුම**

ආනන්ද නාගහගේ

**මුද්‍රණය**

කතෝලික මුද්‍රණාලය
කොළඹ 08.


## පිටුවෙන් පිටුව..........


2 කවරයේ කථාව
3 හෙළිදරව්ව
5 අභිනව ජනපතිට භක්ති ප්‍රබෝධනය ශුභාශිංසනය
7 සත්‍යයට, යුක්තියට ... ටී. සුනිල් ප්‍රනාන්දු
10 නත්තල ජනතා මංගල්‍යයක් ... මලින්ත බෝපෙආරච්චි
11 කඳුළු මකා .... - නීටා අයි. ප්‍රනාන්දු
12 ධර්මය අහනවාද ? ... - ජෝ. සංගපාලාආරච්චි
14 කඳුළු සඟවන් ... - කීර්ති සඳරුවන් ප්‍රනාන්දු
කඳුළයි සිනහවයි - දිලක්ෂි ශිරන්‍යා රුද්‍රිගු
15 කිතුනු දිවියට ... - ජේ. එච්. සඳුනි වාසනා
16 කඳුලේ සිනහව - වෛද්‍ය සචිත මෙන්ඩිස්
17 ඔබව රකින්නට ... - රූපස් ප්‍රැන්සිස්
18 කෙටිකතාව - ඇග්නස් චන්ද්‍රකාන්ති
20 කුරුලු පවුල - දිමිත්‍රි යොහාන් ප්‍රනාන්දු
21 කාව සිත - චමත් බි. පයාගල
අමිතගේ හද ගැස්ම - සී. අමිත
22 **Modernizing Sunday** - Fr Eric Lakman OMI
23 හමුවෙති සමුගනිති - C J E D
24 අතිනත් ගත් ... - පස්කල් ජයමාන්න
කඳුළයි සිනහවයි - පී. ඩබ්. සුනිල් ප්‍රනාන්දු
25 ඕං එහෙනං - සූරිය මාමා
26 පුංචි විකුම් - තරු නැන්දා
27 ප්‍රහේලිකා අංක - 82
ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා
28 ප්‍රහේලිකා අංක 80 පිළිතුරු
29 අ. පො. ස. (සා. පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය I
ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය
31 අ. පො. ස. (උ. පෙළ) ක්‍රිස්තියානි ධර්මය ...
එස්. හේමාල් පෙරේරා

භක්ති
ප්‍රබෝධනය

වසර 1899 සිට අඛණ්ඩව
එළිදක්වන භක්ති ප්‍රබෝධනය
ශ්‍රී ලංකාවේ පළවන
ඉපැරණිම සිංහල සඟරාවයි.
භක්ති ප්‍රබෝධනය
නිර්මල මරිය නිකායේ
කොළඹ ප්‍රාදේශිකයේ
භාරකාරත්වය යටතේ
පළවන ප්‍රකාශනයකි.
(නි.ම.නි.)

Bhakthi Prabodhanaya,
Published continuously
since 1899, is the oldest
Sinhala magazine
in Sri Lanka.
Bhakthi Prabodhanaya,
is owned and published by
the Colombo Province of the
Oblates of Mary Immaculate.
(O.M.I.)




## කවරයේ කතාව

මනුෂ්‍ය උත්පත්තියකදී මුවගට සිනහවත් වියෝවකදී නෙතගට කඳුළත් නිරායාසයෙන් මනුෂ්‍ය ජීවිතයේ සිදුවන ස්වාභාවික සංසිද්ධි වේ. එසේම කෙනකුගේ සිනහවක් තවෙකුගේ සතුටට හේතු වීමත් කෙනකුගේ කඳුළක් තවෙකුට දොම්නසක් වීමත් ඉතා ස්වාභාවික සංසිද්ධියක් වේ. එහෙත් වත්මන වන විට බොහෝ අවස්ථාවල අවාසනාවත් ලෙස එය උඩු යටිකුරු වී ඇත. කෙනකුගේ සිනහව තවෙකුගේ ඊර්ෂ්‍යාවටත් කෙනකුගේ දොම්නස තවෙකුගේ සතුටටත් හේතු වී ඇත. දුකට පත්වූවකුගේ වේදනාව හඳුනාගැනීමට නොහැකි තරමටම අඳ වී ඇත. මෙවර කවරයේ කතාව අපව අවදි කරන්නේ සහෘදයාගේ හදගැස්මට සමීප විය හැකි අන්දමට සිත විවර කරගැනීමටත් සංවේදී සිතක් ඇති කරගැනීමටත්ය.

අචල රූපසිංහ

## භක්ති ප්‍රබෝධනය

දායකත්වය එක් වසරකට - රු. 850.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

දායකත්වය වසර දෙකකට - රු. 1700.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

**සියලුම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.**

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපැල :
bhakthi.prabodhanaya@gmail.com
වෙබ් ලිපිනය : bpomi.org

## BHAKTHI PRABODHANAYA

Rs. 850.00 for a year (Including Postage)

Rs. 1700.00 for two years
(Including Postage)

**All articles, subscriptions and inquiries should be sent to this address.**

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com
Web Address : bpomi.org

# කඳුළයි සිනහවයි

හෙළිදරව්ව

අධික ශෝකය, වේදනාව හෝ සතුට වැනි හැඟීම් නිසා දෙනෙතින් වැගිරෙන දව බින්දු හෙවත් නේත්‍ර ජල ස්වල්පය කඳුළු ලෙස අපි හඳුනා ගනිමු. දරා ගත නොහැකි දුකක්, සතුටක් සංවේදනය වන විට ඇසට කඳුළු එකතුවේ.

ශ්‍රී ලංකාවේ බහුතර ජනතාව දිනපතා කඳුළු වගුරුවමින්, හඬමින් අසරණ වී කර කියා ගන්නට මගක් නොමැතිව නොමළත් මිය ගියා සේ ජීවත් වෙති. මිනිසුන් කඳුළු වගුරන්නට හේතු ගණනාවක් ඇත. තමන්ම දැනුවත්ව කරන වැරදි ඇතැම් අවස්ථාවල අවබෝධයකින් තොරව, කිසිදු විමසීමකින් අදහසක් නොගෙන හිතුවක්කාර ලෙස ගන්නා ඇතැම් තීරණ සහ ක්‍රියා නිසා මිනිස්සු දුක් විඳිති. කඳුළු වගුරුවති. මත් ද්‍රව්‍යවලට සහ මත් වතුරට ඇබ්බැහිවීම, තම ශරීරයට ලැබිය යුතු මූලික අවශ්‍යතා නොසලකා හැරීම. නිදසුනක් ලෙස ඒ ඒ වයසට ගත යුතු ව්‍යායාම, කෑම බීම අවශ්‍ය ප්‍රමාණයට අවශ්‍ය වේලාවට නොගැනීම ඇතුළු විවේකය ඉන් සමහරකි. වැරදි ව්‍යාපාර හරහා මුදල් සොයන්නට ගොස් අමාරුවේ වැටීම, පවුල්වල ඇතිවන අවුල් සහගත තත්ත්ව විසඳා ගැනීමට අසමත් වීම, ලෙඩරෝග, ආර්ථික අගහිඟකම්, ගැටුම්, ස්වාභාවික විපත්ති, මරණ, මේ ආදි හේතු නිසා මිනිස්සු දුක් විඳිති. කඳුළු වගුරති. තමන් සමග ජීවත් වන අය ගන්නා ඇතැම් තීරණ නිසා සෙසු අය කඳුළු වගුරති. ඒ අතර විශේෂයෙන් රට පාලනය කළ ඇතැම් දේශපාලකයන් ගන්නා වූ වැරදි තීරණ සහ ක්‍රියාදාම නිසා මුළු ජන සමාජයටම ඇතැම් අවස්ථාවල කඳුළු වගුරන්නට සිදුවිය.

රටේ නීතිය ක්‍රියාත්මක වීමේදී තිබුණා වූ අසමානතා, තමන්ගේ මඩිය තර කර ගැනීමට ගැසූ කොමිස්, වංචා, දූෂණ, කළු ගල් පර්වත කඩමින්, මැටි, වැලි, වනාන්තර අනීතික ලෙස කපමින් රටට කරන ලද විනාශය අති දැවැන්තය.

ආහාර පාන, විදුලිය, ප්‍රවාහණය, බෙහෙත්හේත්, අත්‍යවශ්‍ය භාණ්ඩ සියල්ලම බදු බර නිසා මිල ගණන් ඉහළ ගිය අතර වේතනය හෝ වැටුප ඊට සාපේක්ෂව කුඩා ප්‍රමාණයක් නිසා ඇතැම් අය ජීවිත පවා විනාශ කර ගත්තේ තමන්ට ඊට මුහුණ දීමට හැකියාවක් නොමැතිය යන්න සිතූ නිසා විය හැකිය. නියමිත ආහාර වේල් ගැනීමට හැකියාවක් නැතිකම නිසා ඇතැම් පාසල් දරුවෝ ක්ලාන්ත වී ඇද වැටුණෝය. සමහර සිසුහු පාසල් යාම නතර කළහ. ලක්ෂ සංඛ්‍යාත දූ දරුවෝ මන්දපෝෂණයෙන් පෙළෙන්නට පටන් ගනිති. ප්‍රමිතියකින් තොර බෙහෙත් දීම නිසා රෝගීන්ගේ තත්ත්වය ඇතැම් අවස්ථාවල අසාධ්‍ය විය. සමහරු මිය ගියහ. ඊට එරෙහිව මිනිසුන් හඬ නගන විට විෂය භාර ඇමති ප්‍රකාශ කළේ " රෝහලක් අසල මල් ශාලාවක් ඇත්තේ ඊට පිළියමක් " ලෙස යන්නය.

ලංකාවේ මාර්ග අනතුරුවලින් වසරකට මිනිස්සු 3000 ක් පමණ ජීවිතක්ෂයට පත්වෙති. මෑතකදී ඊට පිළියමක් ලෙස යෝජනා කළේ අනතුරු අවම කරන්නට හැම අනතුරකටම බදු මුදලක් අය කර ගැනීමයි. රට බංකොලොත් වීමත් සමග ලක්ෂ සංඛ්‍යාත ජනතාවකගේ දරිද්‍රතාව දෙගුණ තෙගුණ විය.

2019 වසරේ දී රටේ ආරක්ෂාව නොසලකා තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍ර සපුරා ගැනීමට දැරූ ප්‍රයත්නයේ දී පාස්කු ඉරිදා ප්‍රහාරය වැනි ඛේදාන්තයන්ට ජනතාව බිලි වූහ. ආරක්ෂාවට වගකීම ගත යුත්තන් එය නොසලකා හැරීම මහා ඛේදවාචකයක් විය. ලතෝනි, අඳෝනා, කඳුළු මහ පොළොව උසුලන්නට බැරි තරමට භයානක වී ඒ ව්‍යසනය රටටම සාපයක් විය. මින් ගැලවෙන්නට නානා ප්‍රකාර උත්සහාය, කපටි කතා තැන තැන පැවසුවත් සත්‍ය මරන්නට ඔවුන්ට කිසිදාක නොහැකි බව අදටත් අවබෝධ කර ගෙන නැත. ඒ අන් කිසිවක් නිසා නොව දෙවියන් වහන්සේගේ හස්තය මේ විශ්වය තුළ ඉතා බලගතුව ක්‍රියත්මක වන නිසාය.

"සමිඳාණෝ මිහිතලය පාලනය කරන පිණිස වඩින සේක. උන්වහන්සේගේ ලෝවැසියන් ධර්මිෂ්ඨකමින් ද, සාධාරණකමින් ද, පාලනය කළ සේක" (ගීතා 98 : 9).

ඉසිලිය නොහැකි ජීවන බරට, අකටයුතුකම්, වලට අසාධාරණකම් වලට, දූෂණ වලට සහ වංචාවලට එරෙහිව ජනතාව මහ පාරට පැමිණ උද්ඝෝෂණ

කරන විට ප්‍රශ්න සාකච්ඡා කර විසඳනවා වෙනුවට මර්දනයෙන්, තර්ජනයෙන්, බැටන් පොලු පහර ගසමින්, කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර එල්ල කරමින්, සිරගත කරමින්, විටක වෙඩි උණ්ඩයෙන් ජනතාව මෙල්ල කරන්නට ඔවුනට වුවමනා විහ. රට වැසියන් වහලුන් යැයි ඇතැම් දේශපාලකයන්ට සිතෙන්නට ඇති.

මිනිසුන් විපතට ඇද වැටුණු විට එසේ විපතට ඇද වැටුණු මිනිසුන්ට තළා පෙළා පීඩාවට භාජනය කිරීම විපත් වළක්වා ගැනීමේ ක්‍රියාමාර්ගය විය නොහැකිය. එනමුත් පසුගිය කාලයේදී වැඩිපුරම අපට දිනපතා අසන්නට, දකින්නට ලැබුණේ ගහෙන් වැටුණු මිනිසාට ගොන් රැලම වටකරගෙන දිගට හරහට ඇන ඇන සිටින ස්වරූපයේ සිදුවීම් ය. රටේ ජනතාවගේ දුක, කඳුළු, පීඩනය, ආතතිය, කලකිරීම, ඉවසිය නොහැකි ඉවසීම පසු ගිය ජනාධිපතිවරණයේ දී ඉස් මතු විය. ජනතා හඬට අසංවේදී වූ දේශපාලකයන්ට තම කතිරයෙන් යස පාඩමක් ජනතාව ඉගැන්වූහ. දිනක තම බලය ගිලිහී යන බව මේ අයට කවදාවත් නොසිතුණේ ඔවුන් අධික යස ඉසුරින් මත් වී, කමින් බොමින් ප්‍රිය සම්භාෂණ නෞකාවල පවා පවත්වමින් මුදල් අධික ලෙස වියදම් කරමින් අන්ධ ගමනක් ගිය බැවිනි.

යුක්තිය, සාධාරණත්වය, නීතියේ සමානතාව ස්ථාපිත කර දූෂණය සහ වංචාව බැහැර කරන්නට ගත යුතු ක්‍රියාමාර්ග ගනිමින් නව දේශපාලන සංස්කෘතියක් ස්ථාපිත කරන බව වත්මන් රජය ප්‍රකාශ කළේය. ඡන්දය ප්‍රකාශ කළ බහුතර ජනතාව ඒ කෙරෙහි විශ්වාසය සහ බලාපොරොත්තුව තබා ඇත. ඒ අපේක්ෂා මල් පල ගැනේවා යයි අපි ප්‍රාර්ථනා කරමු.

"කිසිම කෙනකුට මා ඡන්දය දෙන්නේ නෑ" යන වදන් කියන්නෝ තම පුරවැසි යුතුකම මඟ හැරීමට දායක වෙති. එමගින් සිදුවන්නේ නුසුදුසු කෙනකුට පාර්ලිමේන්තුවට ඒමට දැනුවත්ව හෝ නොදැන අවස්ථාව උදා කර දීමයි. එබැවින් මෙතුවක් කාලයක් තිස්සේ රට විනාශය කරා ගෙනියන්නට දායක වූ, නීතියෙන් වැරදිකරුවන් වූ හෝ ඇස් ඉදිරියේ කළ අපරාධ නිසා චෝදනාවට ලක් වූවන් කුමන දේශපාලන පක්ෂයකට අයත් වුවත් පාර්ලිමේන්තුවට නොයවන්නට වග බලා ගැනීම පුරවැසි යුතුකමකි. ඡන්දායකයන්ට පැවරෙන බරපතළ වගකීමකි.

නැණවත් සහ ගුණවත් පිළිගත හැකි කිසියම් මට්ටමකට තම ජීවිතය අන් අයගේ සහ සමාජ ශුභසිද්ධිය වෙනුවෙන් ක්‍රියා කළ හැකි පුද්ගලයන්ව තෝරා පාර්ලිමේන්තුවට පත්කර ගැනීම යුගයේ අවශ්‍යතාවකි. ඒ වගකීම සහ යුතුකම ප්‍රසාද ස්නාපන කැඳවීමේ දිවැසිවර කාර්යයක් වන බවද අමතක නොකරමු. එසේ නොකළොත් අනාගතයේදී සමස්ත සමාජයටම විඳින්නට වන දුක කඳුළු අසීමිතය.

නත්තල අපට සතුට, සාමය, ප්‍රීතිය, සැනසීම, විමුක්තිය ගෙන එන ක්‍රිස්තු උපතේ මංගල්‍යයයි. සතුට, ප්‍රසන්නතාව, අනුග්‍රහය වැනි හැඟීම් අප තුළ ජනිත වන විට ඒ හැඟීම් ප්‍රකාශ කරන්නට මුහුණෙහි පහළ වන විකසිතභාවය සිනාව ලෙස අර්ථකථනය කළ හැකිය. ඇතැම් විට අවමානයට, සමච්චලයට සහ කෙනකුව පහත හෙළන්නට සිනාව භාවිත කළ හැකිය. දේවත්වය මනුෂ්‍යත්වය වැළඳ ගන්නේ මනුෂ්‍යයාව සියලු වහල් පාපී මාර්ගවලින් සහ අන්ධකාරවලින් ගලවා විමුක්තියේ මඟ අයිති කර දීමටය. දේව ප්‍රේමය හරහා එය මෙලොව තුළ යථාර්ථයක් කර හමාරය. ඒ ප්‍රේමය හදවතට දැනෙන අයුරින් අවබෝධ කරගත් විශ්වාසකයන්ට ඒ සඳහා ප්‍රවිෂ්ට වීම එතරම් අපහසු නොවේ. දෙවියන් වහන්සේගේ ප්‍රේමයට අවදි වී ඒ දෙසට පියවර ගන්නට කෙනකු අධිෂ්ඨාන කරද්දී දේව ප්‍රේමයට හානි කරන බොහෝ දෑ අතහරින්නට පුද්ගලයා නිරායාසයෙන්ම පියවර ගනියි. ඇදහිල්ල ශක්තිමත් වන විට නපුරු මාර්ග අත් හරින්නට ශුද්ධාත්මයාණන් වහන්සේ පිහිට වෙන සේක. එවිට ඇබ්බැහිවීම්, වැරදි ආදර්ශය, වංචාව, අධික සුඛවිහරණය, හිස් බස් දෙඩීම, අන් අයට ගින්දර දෙමින් අසමඟිය වැපිරීම වැනි ක්‍රියාවලින් බැහැර වේ. අවම කරයි. දේව ප්‍රේමයට අවංකවම ප්‍රතිචාර දැක්වීමට තරම් නිහතමාන හදවතක් ඔහු/ඇය තුළ ජනිත වේ.

එබැවින් හදවතේ ඇතිවන නිදහස, සන්තුෂ්ටිය මුහුණේ සිනහව තුළින් විකසිත වේ. ජේසු සමිඳාණන්ගේ උපත ගෙනෙන අභ්‍යන්තර සාමය සහ ප්‍රීතිය කෙනකුට ලැබෙන්නේ කිතු උපතේ පරමාර්ථය සියලු වහල් බැම්වලින් මිදෙන්නට අරගල කරමින් ඒ මඟට අවතීර්ණ වීම තුළිනි. එවන් පිවිතුරු චේතනා අවංක මනස්තාපිත හදවත් මාරුවීමකට පිපාසය වන ජනයා අතර කිතු උපත නැවත නැවතත් ජීවමාන නොවේද ?

**සංස්කාරක පියතුමා**

# අභිනව ජනපතිට ශක්ති ප්‍රබෝධනය ශුභාශිංසනය



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නව වන ජනාධිපති
අනුර කුමාර දිසානායක මහතාට
ජනතාවගේ ප්‍රාර්ථනා බලාපොරොත්තු
හැකිතාක් මල්පල ගන්වන්නට හැකිවේවා යයි
ශක්ති ප්‍රබෝධනයෙන් ශුභාශිංසන!
දෙවියන්වහන්සේගේ ආශිර්වාදය වැසි මෙන් වසීවායි යදිමින් ප්‍රාර්ථනා කරමු.

"මනුෂ්‍යයා මෙන්ම
මුනුෂ්‍යයා නිසා පවත්නා
හැම දෙයක්ම
ප්‍රතිසංස්කරණය විය යුතුය".

# සත්‍යයට, යුක්තියට සාක්ෂි දරමින් යහපත් සමාජයක් බිහි කිරීම සඳහා මිනිසුන් තුළ වටිනාකම්, ගුණධර්ම ඇති කිරීම කතෝලික පුවත්පත්, සඟරාවල දිවැසිවර වගකීමක්!

## අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ

*කොළඹ මරදාන පාතිමා අප ස්වාමිදුවගේ දෙව්මැඳුරේදී පැවැති "භක්ති ප්‍රබෝධනය" 125 වන සාංවත්සරික දෙව්දුන්ට තුති පිදීමේ දිව්‍ය යාගයේදී කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් සිදුකළ දේශනය.*



නිර්මල මරිය නිකායේ ප්‍රාදේශීය ශ්‍රේෂ්ඨාධිපති අතිගරු රොෂාන් සිල්වා පියතුමනි, ගරු එමාඩ් දල්පතාදු පියතුමනි, මා ප්‍රියාදර සහෝදර සහෝදරියනි,

ශ්‍රී ලංකා කතෝලික සභා ඉතිහාසයේ ඉතා වැදගත් සන්ධිස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවට නිර්මල මරිය නිකායික පියතුමන්ලාගේ පැමිණීම සඳහන් කළ හැකියි. ඒ කාලයේ ඉංග්‍රීසි ආණ්ඩුව විසින් ආගමික නිදහස තහවුරු කිරීමෙන් පසු ඇතිවුණු ආධ්‍යාත්මික ප්‍රබෝධය තුළ නිර්මල මරිය නිකායික පියතුමන්ලා මේ රටට සැපත් වී, ශ්‍රී ලංකාවේ කතෝලික සභාව ශක්තිමත් කිරීමේ ක්‍රියාදාමයක යෙදුණා. උන්වහන්සේලාගෙන් තෝරාගන්නාලද රදගුරු තුමන්ලා, ශ්‍රී ලංකාවේ කතෝලික සභාව මෙහෙයවන්නට ආශීර්වාද ලබා ගත්තා. ඔවුන්ගේ කැපවුණු සේවාව තුළ මේ රටේ කතෝලික සභාව පුනර්ජීවනයකට භාජනය වෙමින්, එහි මූලික අත්තිවාරම් දමා ගැනීමේ කටයුත්ත ස්වාමින් වහන්සේ විසින් එතුමන්ලා තුළින් පරිපූර්ණත්වයට ගෙනෙනු ලැබුවා. ඒ අය අතර කොළඹ අගරදගුරු පදවියේම අගරදගුරු තුමන්ලා ලෙස සේවය කළ සියලුම නිර්මල මරිය නිකායික රදගුරුතුමන්ලාව මා මේ අවස්ථාවේදී සිහිකරන්නේ හද පිරි බැතියෙන් සහ ස්තුති පූර්වකවයි.

ශ්‍රී ලංකාවේ කතෝලික සාහිත්‍යය දියුණු කිරීම සඳහා මූලික අඩිතාලම යෙදූ ගෞරවණීය ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමාණන් ඇතුළු කණ්ඩායමෙන් පසුව අප රට තුළ සිංහල, දෙමළ භාෂාවලින් කතෝලික ධර්මය ප්‍රචාරය කිරීම සඳහා අවශ්‍යය කටයුතු සූදානම් කළේ නිර්මල මරිය නිකායික රදගුරුතුමන්ලා සහ පියතුමන්ලායි. ඔවුන්ගේ අධීක්ෂණය යටතේ මීට අවුරුදු එකසිය විසිපහකට පෙර එනම් 1899 වසරේදී ආරම්භ කරන ලද "භක්ති ප්‍රබෝධනය" සඟරාව සහ ඊට කලින් එනම් 1866 වසරේදී ආරම්භ කරන ලද "ඥානාර්ථ ප්‍රදීපය" පුවත්පත මෙන්ම "The Messenger" පුවත්පත් හරහාද

කතෝලික සභාවේ දර්ශනය, දහම මේ රටේ ජනතාව අතර ප්‍රචලිත කිරීමට උත්සාහ කළ සහ වෙහෙස මහන්සි වූ කණ්ඩායම තමයි, මරිය නිකායික පියතුමන්ලා. 1881 වසරේ ඉතාලි ජාතික ලුවිජි පිච්චනෙල්ලි පියතුමා විසින් ආරම්භ කරන ලද, මග්ගොන සාන්ත වින්සෙන්ති නිවාසය සහ චරිත ශෝධනාගාරය පදනම් කරගෙන 1899 වර්ෂයේදී මර්සලින් ප්‍රදිනන්දිස් නැමැති ගිහියෙකුගේ සම්බන්ධතාව ඇතිව පළමු කතෝලික සඟරාව ලෙස "භක්ති ප්‍රබෝධනය" සඟරාව මග්ගොන සාන්ත වින්සෙන්ති නිවාසයේ ගරු පියතුමන්ලාගේ සහ සහෝදරතුමන්ලාගේ අධීක්ෂණය යටතේ මුද්‍රණය කරන්නට මෙන්ම ප්‍රචාරය කරන්නට පටන් ගත්තා. ශ්‍රී ලංකාවේ කතෝලික ජනතාව අතර දේව භක්තිය වර්ධනය කිරීම සඳහා භක්ති ප්‍රබෝධනයෙන් සුවිශාල සේවාවක් ඉටුවූ බව මා මේ අවස්ථාවේදී සඳහන් කරන්නට අවශ්‍යයි. එහි පළමු කර්තෘ ලෙස සේවය කළේ එවකට මග්ගොන සාන්ත අන්තෝනි පාසැලේ ප්‍රධානාචාර්යවරයාව සිටි සී. ඩී. අන්තෝනියස් ජයවර්ධන මහතායි. සිංහල භාෂාව හොඳින් හැසිරවූ ඔහු ආගමික සත්‍යතා හොඳින් දැනසිටි බව සඳහන් වෙනවා. ඉංග්‍රීසි හා ලතින් බස්ද ඔහු හදාරා තිබූ නිසා වසර 32 ක්ම මේ සඟරාවේ කර්තෘ පදවිය දරමින් ශ්‍රී ලංකාවේ කතෝලික සභාවට සුවිශාල සේවාවක් ඉටුකළා. නිර්මල මරිය නිකායික පියතුමන්ලාගේ මඟපෙන්වීම හා අධීක්ෂණය යටතේ, වසර 125 ක් පුරා නොකඩවා පවත්වාගෙන ආ භක්ති ප්‍රබෝධනයේ නොනිම් මෙහෙවර වෙනුවෙන් නිර්මල මරිය නිකායටත්, එහි ප්‍රාදේශාධිපති පියතුමන්ලාටත්, මේ සඟරාවේ කර්තෘ ධුරයන් දැරූ මරිය නිකායික පියතුමන්ලාටත්, වර්තමානයේ එහි සංස්කාරක ධුරය දරන ගරු එමාඩ් දල්පතාදු පියතුමන්ටත් අපගේ ශුභාශිංසන හා ආශිර්වාදය ප්‍රකාශ කර සිටින්නට මෙය අවස්ථාවක් කර ගන්නවා.

සහෝදර සහෝදරියනි, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ප්‍රඥප්තියේ සඳහන් වන්නේ සෑම කෙනකුටම තමන් කැමති මතයක් දැරීමට, එය ප්‍රකාශ කිරීමට අයිතියක් ඇති බවයි. මෙය මූලික මිනිස් අයිතිවාසිකමක් ලෙස ද හඳුන්වා තිබෙනවා. ශ්‍රී ලංකාව තුළද මේ මූලික අයිතිවාසිකම් පිළිබඳව අපේ රටේ ව්‍යවස්ථා මාලාවේ, මානව හිමිකම් පිළිබඳ කොටසේ පැහැදිලිව සඳහන් වී තිබෙනවා. ශ්‍රී ලංකාව අවුරුදු 75 ක් තිස්සේ, මේතාක් කල් ආරක්ෂා කරගෙන ආ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තවදුරටත් ශක්තිමත්ව පවත්වාගෙන යාම, ශ්‍රී ලංකාවාසී අප සැමගේ වගකීමක් වන බව මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කළ යුතුයි. ශ්‍රී ලංකා ඉතිහාසයට ඉතාමත් වැදගත් ස්ථානයක් වෙන්නට නියමිත නොබෝදා පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය මේ රටේ අනාගතය තීන්දු කරන සන්ධිස්ථානයක් බවට පත්විය හැකි බව අප සියලුදෙනාම දන්නවා.

මේ රටේ පසුගිය අවුරුදු 75 ක කාලය තුළ අපගේ අදහස් නිදහසේ ප්‍රකාශ කිරීමටද, තමන් කැමති මාධ්‍යයක් හරහා ඒ මත ප්‍රකාශ කිරීමටද සීමා මායිම් බොහොමයක් වැටුණු බව සඳහන් කළ යුතුයි. විශේෂයෙන්ම 1978 ව්‍යවස්ථාව තුළින්, මේ රටේ ජනාධිපතිවරයාගේ බලතල සීමාරහිතව දීර්ඝ කිරීම නිසා, ඒ බලතල අන්‍යයන්ට වගවීමක් නැති ආකාරයෙන් ප්‍රකාශයට පත්කරන්නට, භුක්තිවිඳින්නට, ඔහුට ලැබී ඇති සීමාවක් නැති නිදහස නිසා, අද ශ්‍රී ලංකාව තුළ මාධ්‍ය සැහෙන දුරට වැටීමකට ලක්වී තිබෙනවා. එක පැත්තකින් අද ශ්‍රී ලංකාවේ පුවත්පත්, සඟරා සියල්ලක්ම පාහේ, එම පුවත්පත් සඟරා සතු සමාගම් වල හෝ ඔවුන් පෙනී සිටින දේශපාලන පක්ෂවල න්‍යාය ධර්මවල වහලුන් ලෙස කටයුතු කරන බව අපට පෙනෙන්නට තිබෙනවා. ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ දේශපාලඥයින්, සුප්‍රසිද්ධ ධනවතුන් මේ පුවත්පත් හා මාධ්‍ය පාලනය කිරීම නිසා ඔවුන්ගේ මතය පමණක් ස්ථාවර කිරීමට කටයුතු කරන තත්ත්වයක් තුළ යුක්තිය හා සත්‍යය දැනගැනීමට ජනතාවට ඇති අයිතිය ක්‍රමක්‍රමයෙන් උදුරා ගනිමින් පවතින බව ප්‍රකාශ කරන්නට අවශ්‍යයි. ශ්‍රී ලංකාව තුළ ඇති මේ තත්ත්වය, වඩාත් කනගාටුදායක වන්නේ, රට තුළ කිසියම් දෙයක් සිදුවුනාම, එහි නියම සත්‍යතාව ජනතාවට ප්‍රකාශ කරනු වෙනුවට, ඒ ඒ දේශපාලන පක්ෂවලට ගැතිකම් කරන, ගැතිකම්

කරන්නට බල කරන ඇතැම් ප්‍රධාන පෙළේ මාධ්‍යවේදීන් තමන් පිළිගන්නා ඒ දේශපාලන න්‍යාය ධර්මයට පමණක් ගරු කරමින් සත්‍යය විකෘති කිරීමේ ක්‍රියාදාමවල යෙදෙමින් කටයුතු කිරීමයි.

ඇත්ත වශයෙන්ම අප කල්පනා කර බැලුවොත් අප දන්නවා. අද මේ රටේ පළ කෙරෙන එක්තරා පුවත්පතක් රජයට පක්ෂපාතිව කටයුතු කරනවා. එය කෙළින්ම එය රජයේ පුවත්පත බව අපි හොඳින්ම දන්නවා. වෙනත් අදහස් කවදාකවත් ඒ පුවත්පතේ සඳහන් වන්නේ නැහැ. සත්‍යය සිද්ධියක් වුවත් ඒ පුවත්පතේ සඳහන් කරන්නේ, රජයේ නායකයන්ට අවශ්‍යය විදිහට අර්ථකථනය කරලයි. එය කවදාක්වත් යුක්ති ගරුක, සත්‍යවාදී ලෙස මාධ්‍යය තුළින් අදහස් බෙදාගැනීමක් වන්නේ නැහැ. එතැනදි සිදුවන්නේ, මාධ්‍යය මඟින් සත්‍යය යටපත් කරමින් එය විකෘති කරන තත්ත්වයක් පමණයි. එවැනි තත්ත්වයක් තුළ ශ්‍රී ලංකාවේ මාධ්‍යය නිදහසක් තියෙනවයි කියන එක මායාවක් පමණයි කියලා මේ අවස්ථාවේදි ප්‍රකාශ කරන්නට අවශ්‍යයි. මේ රටේ ජනතාවට සත්‍යවාදී, අපක්ෂපාත මතයත් ප්‍රකාශ කරන්නට, ප්‍රකාශ වන්නට අවස්ථාවක් නොවන ආකාරයෙන් මේ මාධ්‍යය හැසිරීම ඉතාමත් ලජ්ජා සහගත දෙයක් ලෙස හඳුන්වන්නට පුළුවන්.

අද වැනි කාලයක අප රටේ 60% ක් පමණවූ ජනතාව ආර්ථික වශයෙන් මහා පීඩාවකට ගොදුරු වී තිබෙන මොහොතක අපට ඒ පිළිබඳව නිදහසේ කල්පනා කරන්නට සිතන්නට, තීන්දු තීරණ ගන්නට ඉඩකඩ අවශ්‍ය බව අප මතක් කර ගත යුතුයි. ඒ නිසා එක් එක් කෙනාගේ දේශපාලන මතයට, න්‍යාය ධර්මවලට වහල් වී කටයුතු කිරීම තුළ අදත්, හෙටත් ශ්‍රී ලංකාව වහල් සමාජයක් බවට පත්කරන්නට කටයුතු කරනවා ඇති. මේ රටේ දේශපාලන පක්ෂ අරගෙන බැලුවොත්, අද එක පක්ෂයක් රජකම් කරල, හෙට තව පක්ෂයක් රජකම් කළාට, දේශපාලන පක්ෂ නොව, ශ්‍රී ලංකාව කියන්නෙ එක දිගටම පවතින රටක් ලෙස, මේ රටේ ජනතාව හැමදා ජීවත්විය යුතු ස්ථානයක් ලෙස ඔවුන්ට අවශ්‍ය නිදහස මේ රට තුළ ස්ථාපිත කිරීම, ශක්තිමත් කිරීම, රටේ දේශපාලන නායකත්වයට පමණක් නෙමෙයි, මාධ්‍යයටද විශේෂ වගකීමක් පැවරෙනවා. ඒ නිසා අදත් හෙටත්, හෙට මොන පක්ෂයක් බලයට ආවත්, ඒ පක්ෂය ඒ ගොල්ලන්ගෙ න්‍යාය ධර්මය විතරක් ප්‍රචලිත කරනවා නම් එයට පමණක් ඉඩදෙනවා නම්, එය අපිට පිළිගන්නට පුළුවන් කමක් නැහැ. සැම කෙනකුටම තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්නට සම්පූර්ණ නිදහස ශ්‍රී ලංකාව තුළ තිබිය යුතුයි. එබැවින් ශුද්ධෝත්තම ප්‍රැන්සිස් පාප්වහන්සේ ප්‍රකාශ කළා සේම, විශේෂයෙන්ම දෙවන ජුවාම් පාවුලු පාප්වහන්සේ "රෙඩෙම්ටෝරිස් මිස්සියෝ" කියන විශ්ව ලේඛනයේ සඳහන් කර ඇති ආකාරයට අප ජීවත්වන යුගයට අවශ්‍ය වන "ඒරෝපාගී" කියන ඒ විවිධත්වයේ අදහස් ප්‍රකාශ කරන ස්ථානය, එනම් ශුද්ධවූ පාවුලු තුමා ඇතැන්ස් නුවරට ගියාම ඒ දර්ශනවාදීන් සමඟ, ක්‍රිස්තු ධර්මය පිළිබඳ තර්ක කළ ස්ථානය වන "ඒරෝපාගස්" කියන ස්ථානය අනුව අදත් ලෝකය තුළ එවැනි "ඒරෝපාගස්" ස්ථාන මතුවී තිබෙන බවත් ශුද්ධෝත්තම දෙවන ජුවාම් පාවුලු පාප්වහන්සේ ඒ විශ්ව ලේඛනයේම සඳහන් කර තිබෙනවා. අප ජීවත්වන මේ යුගය පිළිබඳව උන්වහන්සේගේ ලේඛනයේ සඳහන් කරන්නෙ, මෙන්න මෙහෙමයි. "අප ජීවත්වන මේ යුගයේ එක්විටම වැදගත් වූත්, සිත් ඇදගන්නාසුලු වූත් එකකි. එක අතකින් මිනිසා සංවර්ධනයත්, භෞතික අභිවෘද්ධියත් සඳහා ආයාසයක යෙදෙමින්, භෞතික සහ පාරිභෝගිකත්වයේ පතුලට ගිලෙන්නට යත්න දරන අතර, අනිත් අතට හෙතෙම යථාර්ථය සෙවීමේ දැඩි පරිශ්‍රමයක් යෙදෙන බව අපි දකිමු. ඇතුළාන්ත ජීවිතයක අවශ්‍යතාවය යාච්ඤාවේ සහ භාවනාවේ නව මාර්ග සොයාගැනීම සඳහා උනන්දුවක්ද ඔවුන් කෙරේ අපි දකිමු. බලවත් ආගමික හර පද්ධතියක් ඇති සංස්කෘතිවලටද හිමිකම් කියන, ජනතාව පමණක් නොව ලෞකිකත්වය මත පදනම් වූ සමාජවල අමානුෂිකත්වයට පිළියම් වශයෙන් ජීවිතයේ ආධ්‍යාත්මික පරිමාවල සරණය සොයනු ලැබේ. උදාවී ඇති මේ අලුත් තත්ත්වය හෙවත්

ආගමික පුනරුදය අර්ථවයාකුල භාවයෙන් තොර වී නැත. එවැනි ක්‍රියාකාරිත්වය සඳහා ඇති අවස්ථාද පෙන්නුම් කරයි. මිනිසාට ප්‍රදානය කිරීම සඳහා විපුල ආධ්‍යාත්මික ගුණයක් ශුද්ධවූ සභාව සතු වෙයි. එය "මම මාර්ගයද සත්‍යයද ජීවනයද වෙමියි" කියූ කිතු සමිඳුන් කෙරෙහි වූ උරුමයකි. එය යාච්ඤාවටත් තපස් භාවයටත් ජීවිතයේ යථාර්ථය සෙවීමටත් දෙවියන්වහන්සේ මුණගැසීමටත් ඇති කිතුනු මංපෙතයි. ධර්මදානය සඳහා මෙහිද "ඒරෝපාගස්" ශාලවක් අපි හඳුන්වා ගත යුතුය. ඒ මගින් අදහස් කරන්නේ, මේ "ඒරෝපාගස්" ශාලාව තුළ අප හැම කෙනාටම ලැබෙන වගකීමක් ගැනයි. එනම් විශේෂයෙන්ම අපගේ ආධ්‍යාත්මික ජීවිතය පිළිබඳ ඇති වැදගත්කම මනුෂ්‍ය වර්ගයාට පෙන්වා දීමටද ආගමික ජීවිතය, ආගමික ප්‍රතිපත්ති අනුව අප ජීවිතය මෙහෙයවිය යුතුයි යන්න ප්‍රකාශ කරන්නට ඇති වැදගත්කම කතෝලික සභාව තුළ අපේ වගකීමක් ලෙස අපි හැඳිනගත යුතුය. එය මේ "ඒරෝපාගස්" ශාලවේදී ශුද්ධවූ පවුලු තුමා දුන් සාක්ෂිය වගේ අපේ සාක්ෂියත් එසේ විය යුතුයි.

ඒ නිසා මෙවැනි තීරණාත්මක මොහොතක ශ්‍රී ලංකාව පවතින විටකදී අපට වගකීමක් තියෙනවා විශේෂයෙන්ම මනුෂ්‍යාගේ උත්තරීතරත්වය, ගෞරවය ආරක්ෂා වෙන ආකාරයෙන් සමාජය හසුරුවන්නට මේ රටේ මාධ්‍යය මෙහෙයවන අයට හා මාධ්‍යයට මතක් කර දෙන්නට, අප එය කළ යුතුයි. මන්ද මේ සමාජය දැන් සෑහෙන දුරට මනුෂ්‍ය වටිනාකම් අතින් පිරිහීගෙන යන කාල පරිච්ඡේදයක පවතිනවා. අපි සියලු දෙනාම කල්පනා කරන්නට ඕන, මනුෂ්‍යයාගේ නිදහස ස්වයං පාලන ශක්තිය, ඒ වගේම ආත්ම ගෞරවය, ආරක්ෂාවන ආකාරයෙන් මේ රට ආරක්ෂාකර ගැනීමට අපට ණය යුක්තියක් තිබෙන බව.

මෙවැනි අවස්ථාවක අප අපගේ පුවත්පත්, සඟරා මෙහෙයවන උදවියට මතක් කර සිටින්නේ, බය නැතිව මේ රටේ සමාජීය ජීවිතය දියුණු කිරීම සඳහා සහ රටේ ජනතාවගේ ආධ්‍යාත්මික වටිනාකම් වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කරන ලෙසයි. විශේෂයෙන්ම කතෝලික සමාජය. එහිදී අප ආත්මාර්ථකාමී ලෙස අපේ ගැලවීම ගැන පමණක් සිතනවා වෙනුවට අප අපගේ සොහොයුරු සොහොයුරියන්ගේ ගැලවීම ගැනද සිතමින්, විශේෂයෙන්ම අද ශ්‍රී ලංකීක සමාජය තුළ පිරිහීගෙන යන වටිනාකම් ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාව පිළිබඳ අප කථාකළ යුතුයි. මොන රජයක් බලයට ආවත්, ඒ හැම කෙනකු තුළම තිබෙන ආත්මාර්ථකාමීත්වය ඉස්මතු විය හැකියි. ඒ නිසා අපගේ වගකීම එනම් ප්‍රබුද්ධිමත් ලෙස වගකීමෙන් යුතුව ඇස් ඇරගෙන සමාජයට මුහුණ දීමේ වගකීම, අදත් හෙටත් එකසේ පවතින බව අප මතක්කර ගත යුතුයි. අද අපගේ වගකීම යම් ප්‍රමාණයක පවතීද සමහර විට හෙට එය ඊටත් වඩා වැඩිකර ගත යුතුය.

ඒ නිසා මේ රට දේශපාලනික වශයෙන් මොන පක්ෂය, මොන නායකයා පාලනය කෙරුවත්, මනුෂ්‍ය හා ආධ්‍යාත්මික වටිනාකම් ආරක්ෂා කරන්නට හා එය රටේ නායකයන්ට මතක්කර දීම අපගේ වගකීමක් වෙනවා. ඒක අපේ දිවස්ප්‍රසාදීය වගකීමක් බව අප සැලකිය යුතුයි. ඒ නිසා මේ අවස්ථාවේදී 'භක්ති ප්‍රබෝධන' සඟරාවට මා යෝජනා කරන්නේ, මේ කාලයට ඔබින විදිහට, විශේෂයෙන්ම අද සමාජයේ ඇති විවිධ ප්‍රශ්න ගැන නොබියව, ක්‍රිස්තියානි දර්ශනයට අනුව ජනතාව දැනුම්වත් කරන ලෙසටයි. මේ සඟරාව තුළින් අතීතයේදීත් එසේ වූ බව අප දන්නවා. එය අනාගතයටත් අවශ්‍ය වෙනවා. 'භක්ති ප්‍රබෝධනය' මෙන්ම 'ඥානාර්ථ ප්‍රදීපය', 'කැතලික් මැසෙන්ජර්' වැනි පුවත්පත් සඟරා තුළින්ද මේ සමාජය පිරිසිදු කිරීමේ වගකීම ඉදිරියටම කරගෙන යමු කියා මා යෝජනා කරනවා. ඒ සඳහා අපගේ මේ කතෝලික පුවත්පත් සඟරා සමග අත්වැල් බැඳග නිමින් කටයුතු කරන ලේඛක ලේඛිකාවන්ට, සහ මාධ්‍යවේදීන්ට අවශ්‍ය ශක්තිය, ධෛර්ය සහ දේවාශීර්වාදය ද මා ප්‍රාර්ථනා කර සිටිනවා. ඔබ සැමට ජේසු පිහිටයි!

සටහන හා සේයාරූ **ටී. සුනිල් ප්‍රනාන්දු**

# නත්තල ජනතා මංගල්‍යයක් වන අයුරු

නත්තල් උළෙල, මනුෂ්‍යාත්වය ගත් මහෝත්තම දෙවිඳාණන්ගේ මෙලොව බිහිවීම සිහිපත් කරන දිනය වුවද, එය යම් කාලයකට, දේශයකට සීමා කළ නොහැකිය.

එහි උපත මැවීම දක්වා දිව යයි. මනුෂ්‍යයාගේ පාපය යනු කුමක්දැයි අපට නියමාකාරයෙන් ප්‍රකාශ කළ නොහැකිය. මිනිස් පරපුරේ බිඳ වැටුණු තත්ත්වය මගින් නිරූපණය වන්නේ, මිනිස් වර්ගයාගේ ආරම්භක කාලයේ පටන්ය. ඒ නිසා මිනිසා පාපයෙන් වළක්වා ගැනීමේ පොරොන්දුව ලැබෙන්නේද මිනිස් සංහතියේ, පාපය නිසා ලද නින්දිත ස්වභාවය තුළින් ධ්වනිත වන මිනිස් ජනතාව ගේ ආරම්භයත් සමගද යන්න ගැන සොයා බැලිය යුතුය. ඒ නිසා මනුෂ්‍යයා පාප රැහැනින් මුදා ගැනීමේ අමිල පොරොන්දුව ඉදිරිපත් වන්නේ ද මිනිසාගේ ආරම්භයත් සමග බව අපට පිළිගත හැකිය. එබැවින් ඒ ඓතිහාසික පොරොන්දුව ඉෂ්ට වන නත්තල් මංගල්‍යය සදාතන උදාරත්වය පවත්නා මංගල්‍යයක් බව අපට අවිවාදයෙන් පිළිගැනීමට සිදුවේ.

බිඳ වැටුණු මිනිස් පරපුරට දෙවිඳුන් දුන් පොරොන්දුව ඉෂ්ට කිරීම පිණිස, ප්‍රථමයෙන් එක් අයකුද, ඉන් අනතුරුව ඔහුට අයිති ජනතාවක්ද තෝරා ගත් අතර, ඔවුන් සෙසු පිරිසෙන් වෙන් කර තම ජනතාව ලෙස හැඳින්වුවද, සත්‍ය වශයෙන්ම ඔවුන්හට සියලු අවස්ථාවලදී විවිධාකාර වරප්‍රසාද, යස ඉසුරු ලැබුණේ නැත. ඔවුන්ට දුෂ්කරතා, අභියෝග, ප්‍රශ්න රාශියක් තිබිණි. ඇතැම් අවස්ථාවලදී ඔවුන් දේව පණත් වලට එරෙහි වීම නිසා ගැටලු රැසක් උද්ගත වූ බව පෙනේ. ඔවුන්ට වහලුන් ලෙසද කටයුතු කිරීමට සිදුවිය. දෙව්පියාණන් වහන්සේ ඔවුන්ගෙන් බලාපොරොත්තු වූයේ දෙවිඳුන්ට පක්ෂපාත වීම පමණක් නොව පිවිතුරු ජීවිතයක්ද බව ගැලවීමේ ඉතිහාසය දෙස බැලීමේදී ගම්‍ය වන්නකි.

එසකියෙල් දිවැසිවරයා පෙන්වා දෙන්නේ බැටළුවන් බලාගන්නා එඬේරුන්, තම කාර්ය භාරය ඉටු නොකර තම සුව පහසුව ගැන පමණක් උත්සුක වීමත්, බැටළුවන් තම සැප විහරණය පිණිස භාවිතයට ගැනීම නිදසුන් කර ගනිමින් කටයුතු කිරීම මුල් කරගත් ආගමික, ජාතික නායකයන් සම්බන්ධවයි.

එඬේරුන්ගේ ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලය වශයෙන් ඉදිරිපත් කරන්නේ, බැටළුවන් ආශ්‍රිත හැඟීමක් තිබෙන ඔවුන් ආරක්ෂා කර ගනු ලබන නිත්‍ය කාලීන එඬේරකුගේ වැඩීමයි. එයින් අදහස් කරන්නේ කිතු සමිඳාණන් මිනිස් බව ගෙන වැඩීමයි. ඒ අන්දමට මීකා, යෙසායා යන දිවස්ප්‍රසාදිවරුන්ද ඒ සදාකාලික පොරොන්දුව ඉෂ්ට කිරීම තුළින් මතුවන නව සමාජය පිළිබඳ කරුණු සඳහන් කරමින් උන්වහන්සේ උණුසුම් අන්දමින් පිළිගැනීමට ජනතාව සූදානම් කරන අතර ස්නාවක ජුවාම් තුමා පොදු ජනතාව පශ්චාත්තාපය කරා පෙරමුණ ගෙන ක්‍රියා කරන්නේ, සියලුදෙනා අපේක්ෂිත විමුක්තිදායකයාණන්ගේ නැවුම් දිවිය රස විඳීමේ උත්කර්ෂවත් කොන්දේසිය ලෙස අනාවරණය කළ හැකිය.

විමුක්තිදායකයාගේ වැඩම කිරීම එක් යුගයක් හෝ යම් යුගයක් පසු කරමින්, අලුත් යුගයක් ආරම්භ කිරීමක් නොවන අතර එය පොරොන්දුව ඉෂ්ට කිරීම සඳහා සූදානම් කර තිබෙන යුගය පරිපූර්ණත්වයට පත් කොට නව යුගයක් සඳහා අවතීර්ණ වීමකි. ජේසුස් වහන්සේ තුළ පැරණි ගිවිසුමත්, නව ගිවිසුමත් ඒකාත්මික වීමක් සිදුවේ.

උන්වහන්සේ පවසන්නේ "මම පැමිණියේ ව්‍යවස්ථාව අවලංගු කිරීමට නොව පූර්ණත්වයට පත් කිරීමට බව ඉතා පැහැදිලිව තහවුරු වන යථාර්ථයකි. මෙහිලා අප විසින් අවබෝධකර ගත යුතු දෙයක් ඇත. එනම් විමුක්තියේ පොරොන්දුව පැරණි ගිවිසුමේ අය සඳහා කරනු ලැබූ දෙයක් පමණක් නොව සියලු මිනිසුන් සඳහා පොදු වූවක් වන බවයි. එදා සිමියොන් දිවැසිවැසිවරයා කළ ප්‍රකාශය අනුව ළදරු ජේසු තුමා හට මේ දක්වා ආදි පියවරුන්ට, දිවැස්වරුන්ට දුන් පොරොන්දුව ඉෂ්ට වීමකි. ක්‍රිස්තුන් වහන්සේ මිනිස් බව ගන්නේ සදාකාලිකව අප සමග සිටීමටය. සව්ලෝ සතුන්ට විමුක්තිය උදා කර දීම සඳහාය. මෙනයින් ප්‍රත්‍යක්ෂ වන්නේ නත්තල් පණිවිඩය සදාතන වන බවයි. ලෝක සත්‍යයක් පමණක් නොව යථාර්ථයක් වන බවයි. එවැවින් නත්තල අපට අඩු ලංසුවෙන් සැලකිය නොහැක්කකි. නත්තල ආනන්ද ජනක උත්සවයකි. බාහිර වශයෙන්ද සන්තෝෂ වීම, තවත් අයකුගේ සිත් රිදීමකට තුඩු නොදෙන්නක් විය යුතුය.

නත්තල් මංගල්‍යය ආශ්‍රිත යටගියාව තුළින්ද තහවුරු වන්නේ එය ප්‍රීතිමත් උළෙලක් වන බවයි. නත්තල් උළෙල, මිනිස් ජනතාවට විමුක්තිය සලසන්නක් විය යුතුය. අසරණ ජනතාවගේ වේදනාවට සංවේදි වන උත්සවයක් බවට නත්තල් උළෙල පරිවර්තනය කර ගැනීම තුළින් අපට එහි ආධ්‍යාත්මිකත්වය ආරක්ෂා කර ගැනීමට පුළුවන. නත්තල් මංගල්‍යය ආශ්‍රිතව කරනු ලබන සැම දෙයක්ම එහි පරිශුද්ධත්වයට හානිකර දෙයක් නොවන්නට මෙන්ම එහි අද්විතීය බවටද හානිකර දෙයක් නොවන්නට වග බලා ගත යුතුය. එකිනෙකා තුළ පවතින විවිධත්වයට, සංවේදිත්වයට, බාධා කර නොගෙන කටයුතු කරන්නට අප ක්‍රියා කරන්නේ නම් එය දේව අභිමතය වන්නේය.

මලින්ත බෝපෙආරච්චි - දලුගම, කැලණිය.

# කළුළු මකා... හස කැණ් අමුණා!

ගව හලක් තුළ
දිදුල වූ දෙව් සෙනෙහස
පැතිර වූ මුක්තිය ලෝ සතට
අසිරිමත් මැ දිනය යි
කිතුනු හදවත්වලට - නත්තල !

එකලු කර ගගන තලය ම
පායා ආ දිගු තරුව
පැදුවා සේ සිතේ
සාමයේ මහ සුමග
සග ලොවේ අම කරුණාව - පෙන්වා !

ප්‍රේමයේ මහ මුදු ගුණ
බැහැපත්කමේ අම අරුමැතිය
ගෙනෑ සම - සමව
සනහස් සිත්වල සහනය ම
පෙන්වූයේ ලොවට 'සුදු පවුල' එදා

දුක් හදවත් පුරවලා සාමයෙන්
තුටු සිනා නංවා සහනයෙන්
වැඩි ලොවට දෙව් පුත් කුමරුවන්
පතළේ මහා කරුණාවෙ අබිමන්

මතක් කරවයි එදින අප බැති සිත්වලට
දකිනා කල මෙරමා සතුට
එයම බැව් නිරාමිස සුව ! සතුට !

පුදන්නට වන බැව් දැන දැන ම
පිදෙන්නට තරම් අම පෙමක
පරමාදර්ශයේ උත්තම බව දැන
ගන්වා ගනිමු හරි අරුත තුළ

කිතුනු දිවියක සුමග තුළ
සනසා ලමු හදන් දුක් විඳින
එයම වේ මැයි! සැම දාම නත්තලත්
අත් විඳුම

නීටා. අයි. ප්‍රනාන්දු
ඇටකොරසා, පේරලන්ද, රාගම.

# ධර්මය අහනවාද ? ධර්මය තුළ ජීවත් වෙනවාද ?

වර්තමාන කිතුනුවන් තුළ දහම ඇදහීමට ජනප්‍රිය විනෝදාත්මක ජීවන ක්‍රමයක් ලෙස ජනගත කරගෙන ඇති අතර ධර්මය නොහොත් කිතු සමිඳුන් දේශනා කළ ප්‍රේමයේ දහම් මඟ තුළ ජීවත්වීම ප්‍රතික්ෂේප කර ඇත්තේය. කිතු දහමේ බෙදා හදා ගැනීමේ ජීවන ක්‍රමය දැඩි පීඩනයකි. කිතු සමිඳුන් දහම දේශනා කරමින් යන අතර උන්වහන්සේ ශුද්ධවූ ප්‍රකාශනය දහම ඇදහීම හා දහම තුළ ජීවත් කළ යුතු දැක්ම ජනගත කළේ මෙසේය.

'එබැවින් ඔබ පූජාසනය වෙත පඬුරක් ගෙනා කල ඔබ සහෝදරයා ඔබට විරුද්ධව යම් කිසි අමනාපයක් ඇතිව සිටි බව එහිදී, සිහිවී නම් පඬුර පූජාසනය ඉදිරියේ තබා ගොස් පළමු කොට සහෝදරයා හා සමගි වී පසුව අලුත් පඬුර පුදන්න' (මතෙව් 5 : 23 - 24). කිතු සමිඳුන් මානව සංහතියට දේශනා කළේ ජීවිත තුළින් ක්‍රියාත්මක විය යුතු දහමකි.

දේව රාජ්‍ය ලබා ගැනීමේ එකම මාර්ගය කිතු සමිඳුන් දේශනා කළ ධර්මය තුළ දෝත් නගාගෙන දණගහමින්, බඩ ගාගෙන යමින් ඉටි පහන් මල් පූජා කරමින් මංගල්‍යය පවත්වා, ජොලි කරමින් හා දේශීය විදේශීය වන්දනා චාරිකා යමින්, දේව රාජ්‍යය කිසිදාක ලබා ගත නොහැකිය. ශුද්ධවූ බයිබලයේ දේව වාක්‍ය ඊට සාක්ෂි දරන්නේය. කිතු සමිඳුන් දේශනා කළ දහමට අනුව අපේ ජීවිත තුළ එකිනෙකා අතර සැබෑ ලෙස සියලු සම්පත් බෙදා හදා ගනිමින් ප්‍රේමය හා මානව දයාවෙන් යුතුව නැති බවේ පීඩා විඳින්නන්ගේ කඳුළු පිස දැමීමට කැප කරන්නේ නම් බාහිර වත් පිළිවෙත් කොපමණ කලත් අප සැබෑ කිතුනුවෝ නොවන්නෙමු. සැබෑ ප්‍රේමයේ කිතු දහම මානව සංහතිය තුළ ක්‍රියාත්මක කළ යුත්තේ කෙසේද යන්න ගැන උන්වහන්සේ දේශනා කළේ මෙසේය.

'ඔබ පොළොවෙහි ලුණුය. ලුණුහි ලුණු ගතිය නැති වුවහොත් එයට ලුණු රස කවන්නේ කුමකින්ද? ඉන් පසු ඒවා ඉවත දමනු ලබන්නට මිස අන් කිසිවකට සුදුසු නැත. ඔබ ලෝකයේ ආලෝකය ය. කන්දක් මත පිහිටි නුවරක් සැඟවිය නොහැකිය. එවිට එය ගෙදර වැසි සියල්ලනට ආලෝකය දෙයි. එමෙන්ම ඔබේ යහපත් ක්‍රියා ස්වර්ගයේ වැඩ වසන ඔබේ පියාණන් වහන්සේට ප්‍රකාශ කරනු පිණිස ඔබේ ආලෝකය ඔවුන් ඉදිරියෙහි බබලවන්න' (මතෙව් 5 :13 - 15).

ඕනෑම පිළිවෙතක් ඇදහීම පහසුය නමුත් එය තුළ ක්‍රියාත්මකව ජීවත් වීම අපහසු විය හැකිය. ක්‍රිස්තුස් වහන්සේගේ කිතු දහම තුළ ජීවත් වීමේ ක්‍රියා දාමය දේව ජනතාවට දේශනා කිරීමෙන් පසු උන්වහන්සේ මානව සංහතියේ විමුක්තිය වෙනුවෙන් කුරුසියෙදී ජීවිත පූජා කිරීමෙන් පසුව තුන්වෙනි දින මරණය පරදා උත්ථාන වී යළි ශ්‍රාවකයන් අතර ජීවත් වීමෙන් පසු උන්වහන්සේ දේව රාජ්‍ය ලබා ගැනීමේ දහම සකල ලෝකයාට ගෙනගොස් ජනගත කරන ලෙස එය ශ්‍රාවකයන්ට ප්‍රකාශ කර ස්වර්ග රාජ්‍ය කරා ගිය සේක. ඉන් පසු ශුද්ධවූ පේදුරු තුමා ඇතුළු අපෝස්තුලුවරුන් හා ශ්‍රාවක දේව ජනතාව ජෙරුසලමේදී රැස් වී දේව වචනය අනුව කිතු දහම ගොඩ නැගූ අයුරු ශුද්ධවූ බයිබලයේ අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේ සඳහන් වන්නේ මෙසේය,

මෙම පිළිවෙත කිතුනු සභාවේ සහ සෑම කිතුනුවකුම අධ්‍යනය කළ යුතු වුවත් මේ බෙදා හදා ගැනීමේ දැක්ම ජනගත කිරීමේ ක්‍රමයක් නොමැති වීම නිසා අපෝස්තුලුවරුන් ගොඩ නැගූ ජෙරුසලම් සභාව දිළින්ඳන්ගේ සභාව නොහොත් සැබෑ කිතු දහම වර්තමානයේ දක්නට නොමැති අතර ඒ වෙනුවට ජනගත වී ඇත්තේ වත් පිළිවෙත් හා ශුද්ධවර වන්දනාවක් පමණක් බව ඉතාම අකමැත්තෙන් වුවත් අපට පිළිගැනීමට සිදු වී ඇත්තේය. පළමු කිතු දහම ගොඩනැගුණ අයුරු ශුද්ධවූ බයිබලයේ අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේ විස්තර වන්නෙ මෙසේය.

'ඔවුහු ප්‍රේරිත වරුන්ගේ ඉගැන්වීමෙන්ද සහභාගීකමෙන්ද, පූපකැඩීමෙන්ද, යැදුමෙන්ද

නිතර කල් ගත කළහ. සියලු දෙනා තුළ ගෞරාන්විත සිහිනයක් ඇතිවිය. ප්‍රේරිති වරුන් අතින් බොහෝ අරුම පුදුම දේ හා ලකුණු සිදු විය. සැදැවත් සියල්ලෝ එක් වී හැම දෙයක්ම පොදුවේ තබාගත්හ. ඔවුහු තමන්ගේ ඉඩකඩම් හා දේපළ විකුණා එකිනෙකාගේ වුවමනාවේ හැටියට සියලු දෙනා අතරෙ බෙදා දෙන ලදි.' (ශුද්ධවර ලූක් අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත 2 - 42 : 45)

තව දුරටත් ඔවුන් දේව වචනය තුළ දහම ක්‍රියාත්මක කළේ මෙසේය. එකල සැදැවත් සමූහය එක්ව එක්සිත්ව සිටියහ. තමන් සතු දෙයින් කිසිවෙක් තමාගේම යයි නොකීය. සියල්ල පොදුවේ තබාගත්හ. ස්වාමීන්වන ජේසුස් වහන්සේගේ පුනර්ජීවනය ගැන ප්‍රේරිතයෝ ප්‍රබල ලෙස සාක්ෂි දුන්හ. ඔවුන් සියල්ලන් කෙරෙහි දේවප්‍රසාද බහුලව පවතින අග හිඟ ඇති කිසිවෙක් ඔවුන් අතරේ නොවූහ. මන්ද මතු පිට හෝ ගෙවල් හෝ අයිතිකරුවෝ ඒවා විකුණා එයින් ලත් මුදල් ගෙනවිත් ප්‍රේරිතයන්ගේ පාමුල තැබූහ. ඒ මුදල් එකිනෙකාගේ වුවමනාවේ හැටියට බෙදා දෙන ලදී (ශුද්ධවර ලූක් අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත 4 - 32 : 35). ඒ බෙදා ගැනීමේ ප්‍රේමයේ කිතු දහමට සිදු වුයේ කුමක්ද ?

බෙදා හදා ගැනීමේ ක්‍රමවේදය සභාව තුලින් අහොසි වුයේ කවදාද? අද අපේ මීසම් වල කිතුනු පවුල් අතරේ පීඩනයට පත් සහෝදරයන් අතරේ බෙදා හදා ගැනීම ප්‍රේමය හා මානව දයාව නොපෙනී ගොස්ය. ඔවුන් එවැනි ප්‍රේමයේ දහමක් ගැන අසාවත් නැත්තේය. දේව වචනය තුළ ප්‍රේමයේ දහම අපේ ජීවිත තුලින් ක්‍රියාත්මක නොවීම නිසාවත් පිළිවෙත් දහම ඉස්මතු වී ඇත්තේය. අද අපේ කිතුනු මීසම්වල පවුල් අවුල් වී ඇති අයුරු පැහැදිලි ලෙස දැකිය හැකිය. ප්‍රේමය මානව දයාව වෙනුවට බය, පලිගැනීම්, දුශ්චරිතය තමන් පමණක් ජීවත් වීමේ සංකල්පය ඉස්මතු වී ඇති අයුරු කොතරම් අවාසනාවන්තද? කිතුනු සභාව විශ්වය තුළ සංවිධානාත්මකව ප්‍රබල වුවත් ප්‍රේමයෙන් තොර කිතුනු දහමක් ඇති විය නොහැකිය.

අද කිතු දහම ලෙස අප අදහන වත් පිළිවෙත් කිසිවක් අද ඉටු කළාද කියා අවසන් විනිශ්චයේ දී දෙවිඳුන් ප්‍රශ්න කරන්නේ නොමැති බව ශුද්ධවූ බයිබලය සාක්ෂි දරන්නේය. නැති බැරි පීඩනයට පත් අපේම සහෝදර ජනතාවට අපි අත දුන්නේමුද? අවසන් විනිශ්චයේදී දෙවිඳුන් අසන එකම තීරණාත්මක ප්‍රශ්න එපමණය. දැන්වත් අප එම තීරණාත්මක ප්‍රශ්නයට කැපවී අපට හැකි අයුරින් නැති බැරි අයට අත දීමට කැපවෙමු. ඒ අත දීම දෙවිඳුන්ට අත දීමක් ලෙස දෙවිඳෝ ප්‍රකාශ කරති. ශුද්ධවූ බයිබලයේ දේව වචනය ඊට සාක්ෂි දී ඇත්තේය. එසේ නොවුණහොත් ශුද්ධවූ බයිබලයේ දේව වාක්‍ය අනුව සදාකාලික නිරය හිමිවන බව ජේසුස් වහන්සේ ප්‍රකාශ කරන සේක. ඒ මෙසේය. අපේ ජීවිත තුළින් ප්‍රේමය බෙදා හදා ගැනීම ප්‍රතික්ෂේප වුවහොත් දේව වචනය මෙසේ ක්‍රියාත්මක වන්නේය.

එවිට උන්වහන්සේ ඔවුන්ට උත්තර දෙමින් සැබැවින්ම මම ඔබට කියමි. මොවුන්ගෙන් ඉතාම සුළු තැනැත්තාට වුවද අත දීමක් උපකාරයක් නොකළා නම්, එය නොකළේ මම යැයි මට යැයි වදාරන සේක. මොවුහු අත හිත නොදුන් අය සදාකාලික දඬුවමට ද (නිරයටද) දැහැමියෝ සදාකාලික ජීවනයට ද (ස්වර්ගයට ද) යවන්නෝය ( මතෙව් 25 : 45- 46).

**ජෝ. සංගපාලාආරච්චි**
පමුණුගම



# කඳුළයි සිනහවයි

නත්තල ගෙයි දොරකඩට වඩින්නේ
සාමයේ කුමරුගේ උපතයි එන්නේ
අප හැමගේ සිත් ප්‍රීතියෙන් ඉපිලී යන්නේ
සතුටින් සමරමු අප සැම නත්තල

දුගී ජනයාගේ කඳුළු සෝ සුසුම්
පිස දමමු මේ නත්තලේ
ඔවුන් සමඟ බෙදා හදා ගනිමින්
මේ නත්තල අර්ථවත් කරගනිමු හැමදෙන

කඳුළු අතුරින් සිනාසෙන්නට
ජේසුනි ඔබමයි අප හට මඟ පෙන්වූයේ
ජීවිතයේ නිවැරදි අරුත වටහාගෙන
සමරමු මේ නත්තල හද පිරි බැතියෙන්

දිවියේ යහමඟ පෙන්වා දුන මැන
දිවියේ සෝ සුසුම් කඳුළු අතුරින්
ඇවිද යන්නට අප හට මේ නත්තලේ
ආලෝකය දුන මැනවි සමිඳුනි

**දිලක්ෂි ශිරන්‍යා රුද්‍රිගු**
ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමය - කොළඹ - 07



## කඳුලු සඟවන් සිනහ වූ අම්මා ...

එදා කිව්වේ,
විඳවන්න වේවි කියල වේදනාවක්,
කඩු හතකින් අනින.
වගුරන්න වේවි කියල කඳුළු
ගංගා පිටින් ගලන්,
උහුලන්න වේවි කියල නින්දා,
සමාජයක්ම ගරහන.
ඒත් නෑ කවමදාවත්,
විරුද්ධ වුණේ, නෑ කිව්වේ,
උඩින් ආ හඬට.
හැම වෙලාවෙම සැදී හිටියෙ,
ඉටු කරන්න ඒ කැමැත්ත.
කඳුළෙන් දුකෙන් නම් නෙමේ,
ප්‍රීතියෙන් ඉපිලාගෙනයි හිටියෙ,
හැම මොහොතකම ...

**එල්. කීර්ති සඳරුවන් ප්‍රනාන්දු**
දිව්‍ය හෘදයේ ආධුනික නි.ම.නි. දෙව්සත්හල
"සිදුපියනිල", බණ්ඩාරවෙල.



# කිතුනු දිවියට කඳුලින් සිනහව

අපි ප්‍රසාද ස්නාපනය ලබා දේව දරුකම ලබා ගන්නා අතර කිතුනු දිවිය ගත කිරීමට ආරම්භ කරන්නෙමු. ප්‍රසාද ස්නාපනය තුළින් අපි සැවොම ජන්ම පාපයට සමාව ලබා ගන්නා අතර ශුද්ධ වූ සභාවේ සමාජිකයන් බවට පත් වෙමු. අප ලබා ගත් දේව දරුකම තුළ, දෙවියන්වහන්සේ තුළ ස්ථිරව සිටීමට අප උත්සාහ කළද, නපුර රජකම් කරන මේ පොළෝතලය මත සැරිසරන යක්ෂයාගේ ක්‍රියා නිසා කිතුනු දිවිය තුළ ස්ථිරව සිට ඉදිරියට යෑමට අපට නොහැකිය.

ජේසුස් වහන්සේගේ ජීවිතය තුළ පරික්ෂා තිබු බවත් ඒ පරික්ෂා උන්වහන්සේම නැති කරගත් බවත් ශුද්ධ වූ ලියවිල්ල අපට පෙන්වා දෙයි (ශු. මතෙව් 4:1-11) . එහෙත් අපට පැමිණෙන බොහොමයක් පරීක්ෂා අප තුළ ඇති ඇදැහිල්ලෙහි මදිකම නිසාත් දෙවියන්වහන්සේ තුළ අපහට ඇති විශ්වාසයේ හීන බව නිසාත් අපට ජය ගත නොහැකිය. ඇතැම් මිනිසුන් බොහෝ දේ දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින අතර එය නොලැබුණු විට ඔවුන් සියල්ලන් දෙවියන් වහන්සේව අවිශ්වාස කර උන්වහන්සේව අතහැර විවිධ වූ මිථ්‍යාදෘෂ්ටික ඇදහිලි පසුපස යන අවස්ථාද බොහෝවේ.

මෙලෙස ජීවිතය තුළ දුක් කරදර වේදනා පැමිණෙන විට දෙවිකෙනකු නොමැති බව අප කාගෙත් සිතට පැමිණෙන සිතුවිල්ලකි. මේ අකාරයට ඇතැම් මිනිසුන් දෙවියන්වහන්සේ විශ්වාස නොකරන අතර ඔවුන් නිරය සහ සදාතන ජීවිතය උදා කර දෙන ස්වර්ග රාජ්‍යය පිළිබඳව ද කිසිසේත් විශ්වාස කරන්නේ නැත. අයහපත්, පව්කාර ක්‍රියා කරන කිසිවෙක් ස්වර්ග රාජ්‍යය හිමිකර ගන්නේ නැත. ස්වර්ග රාජ්‍යය හිමිවන්නේ යහපත් මනස්තාපනයක් තුළ සිත් හරවා ගත් දෙවිපියා පසු පස ගමන් කරන බැහැපත් විශ්වාසකයන්ට පමණි.

පව්කාර ජීවිත ගත කරන මිනිසුන් වෙනුවෙන් ඔවුන්ගේ ආත්ම ගැලවීම සඳහා විවිධාකාර වූ ගැලවීමේ ක්‍රමවේද ජේසුස්වහන්සේත්, මරියතුමියත්, සාන්තුවර / සාන්තුවරියනුත් මගින් අපට පෙන්වා දී තිබේ. ඒ ක්‍රමවේද අනුගමනය කරමින් පව්කාර මිනිසුන් බොහෝ දෙනකුගෙන් ඉතාමත් සීමිත පිරිසක් පමණක් තම ආත්මයන් ගලවා ගැනීමට අරගලයක් කරති.

"ඇතැම් අය නිරය කියා තත්ත්වයක් ඇති බව විශ්වාස නොකරති. එහෙත් ඔවුන් නිරයට ගිය පසු ඒ ගැන විශ්වාස කිරීමට සිදුවන බව" වරක් පියෝ පියතුමා පවසා ඇත.

අප අසා ඇති ආකාරයට නිරය නමැති තත්ත්වය දුක, වේදනාව සහ විලාපය ඇති භයංකාර ස්ථානයකි. එහි සිනාවක්, සතුටක් දකින්නටවත් නැත. අප ජීවත්ව සිටියදී යහපත් ලෙස ජීවිතය ගත කරන සැම කෙනකුටම පැමිණෙන කරදර දුක් වේදනාව ඉවසාගත නොහැකිව සතුට සොයා අයහපත් මාවත්වල ගියද එයින් අප මියගිය පසු අපට ලැබෙන්නේ දුක සහිත වේදනා පමණි.

දේව දයාවේ භක්තිය ලොවට හඳුන්වා දීමට ජේසුස් වහන්සේ තෝරා ගත් ගරු ෆවුස්තිනා කන්‍යා සොහොයුරියට නිරය දැක බලා ගැනීමට ජේසුස් වහන්සේ අවස්ථාවක් දුන් සේක. ඇය පවසන අන්දමට "මිනිසුන් ශරීරයේ එක් එක් ඉන්ද්‍රියයන්ගෙන් කරන ලද පව් සඳහා එම ඉන්ද්‍රියයන්ට විශේෂ වූ දඬුවම් ඇත " මේ පිළිබඳව ඇය ඇයගේ දින පොතේ ලියා ඇත ( දිනපොතේ පිටුව 741 ). එමෙන්ම ස්වර්ග රාජ්‍යය ලබා ගැනීමට අපට බොහොමයක් දුක් පීඩා විඳීමට සිදු වේ. මෙලොව ජීවිතය තුළ මිනිසුන් යහපත් ක්‍රියා කරමින් දෙවියන් පසුපස යමින් ගත කරන ජීවිතය දුක්, කරදර, වේදනා වලින් පිරුණු එකකි. එහෙත් අවසානයේ ඔවුන්ට ලැබෙන්නේ සතුට පමණක් පිරුණු සදාතනික ජීවිතයයි. එය ලබා ගන්නා තුරු අප ජීවිත තුළ කඳුළ තිබුණද සදාතන ජීවිතය ලබා ගත් පසු සතුට අප ජීවිතය තුළ රජකම් කරයි.

**ජේ. එච්. සඳුනි වාසනා පීන්තු**
11 - ශ්‍රේණිය ශු. පවුලේ බාලිකා මහ විද්‍යාලය
වෙන්නප්පුව.

17 වන පිටුවට.....

# කඳුළේ සිනහව

ආදරයේ විරුද්ධ අර්ථය වෛරය වුවාට, බයිබලීය පරිශීලනයේ දී මට හැඟී ගියේ එය බිය ලෙසයි. ආදරය යනු ග්‍රීක භාෂා අර්ථ හා පාලි භාෂා අර්ථ ලෙස සංකීර්ණ වුවත් අපට එය විශේෂ හැඟීමක් ගෙන දෙයි. ආදරය තුළ අප සියල්ලන්ගෙන් පූර්ණ වන අතර බිය තුළ සියල්ල නොමැති හෝ නැතිව යන අවධානය ප්‍රකාශ කරයි.

ඒ නිසා ආදරය මහෝත්තම දෙවි සමිඳාණන් ගෙනුත් බිය හෝ සැකය සාතන්ගෙනුත් ලැබෙන බව අප සහ අපගේ සරල වැටහීමයි.

Elohim, El-shadai, Yehova Shamma, Lord our provider, Lord our healer ලෙස විවිධාකාර ලෙස අප පියාණන්ගේ ආදරය තුළ සන්තෘප්ත වුවත් සෘණාත්මක බිය ගෙන දෙන සාතන්ගේ ස්ප්‍රීතුව නිරන්තරයෙන් අපව දෙවියන්ගෙන් ඈත් කරන්නට උත්සාහ දරයි. මේ සෘණාත්මක ස්ප්‍රීතුව අපව ලෝකයට මාංසයට හා සාතන්ගේ වසඟයට ගැනීමට චිත්ත ආවේග මෙහෙයවන අතර මේ මාංසමය බලාපොරොත්තුවල මනුෂ්‍යයා බැඳ තබයි. දැනුම නමැති තහනම් ගසේ ගෙඩි කන්නට බල කරයි. කිසියම් රෝගයකට සුවය දෙවියන් ලබා දෙන විට දැනුම නමැති ගසින් එය ප්‍රශ්න කරයි. ස්නායු ඔත්පලව ඇට කටු කැඩී සෛල සංයුතිය වෙනස් වුවත්, සැණෙකින් සුව වන්නේ කෙසේදැයි ප්‍රශ්න කරයි.

වෛද්‍යවරයකු වූ විට ද මුලදී දැනුම පමණක් කරණකොටගෙන මේ නොතේරේ. එහෙත් ඔබ ශුද්ධාත්මයන් තුළ පූර්ණ නම් ඔබට දෙවියන්ගේ ප්‍රඥාව ලැබෙනු ඇත. එය මේ සෑම දෙයම ඔබට විස්තර කර දෙනු ලබයි. දේව වචනය ඇසීමෙන් විශ්වාසයත් ඒ මුහුකුරා යාමෙන් ඇදහිල්ලත් අපට ලැබෙන අතර ඇදහිල්ලේ ගමන තුළ ආදරය අපට හමුවේ. ඒ ආදරය මානව ආදරයෙන් ඔබ්බේ ඇති දෙයක් වන අතර එය පියාණන්වහන්සේ තුළ ලැබෙන ආදරයකි. ඇදහිල්ල ස්ථිර නම් බිය නැත. බිය නැතිනම් සාතන් හෝ මාංසයා ලෝකයා නොමැත එවිට අපට ආගමන කාලයේ දී නිතර ඇසෙන ගීතයෙහි සැබෑ අරුත් ජීවිතයට තේරුම් ගැනීමට පටන් ගනියි.

''Joy to the world."

කඳුළ උපදින්න බියත්, සතුටක් යන දෙකම බලපායි. එවිට අපට සතුටු කඳුළු වන අතර එය සැබෑ දේව වන්දනාව නමස්කාරය හා තුති පිදීම පමණින්ම වන අතර ප්‍රේමය තුළ අප පූර්ණත්වයට පත් කරයි.

මනුෂ්‍ය ආදරය සීමා සහිත වන්නේත්, දේව ආදරය අසීමිත වන්නේත් දෙවියන්ගේ කල්පනා අපගේ කල්පනාවලින් බොහෝ ඔබ්බේ තිබෙන නිසාය. අප දෙවියන්වහන්සේ සිටින්නේ අප සිටින කාලය, ස්කන්ධය, අවකාශය යනු මනුෂ්‍ය භෞතික විද්‍යාත්මක සංකල්පවලින් ඔබ්බේය. ඒ නිසා මහෝත්තම දෙවියන්වහන්සේ අදත්, ඊයෙත්, හෙටත් මා තුළත් ඔබ තුළත් වැඩ සිටින මහා බලවත් විශ්වයේ අයිතිකරුවාණෝ වන සේක.

ඒ නිසා නිරන්තර දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගන්නා අප තුළ ක්‍රිස්තුවරයාණන් නිරන්තර වැඩසිටීමකට ලක්වන අතර යක්ෂයා ප්‍රතික්ෂේප කරන තරමටම උන්වහන්සේ අප තුළ ක්‍රියාකරයි.

සුවය ගැලවීම යථාර්ථයක් වන්නේ ඒ නිසාය. පාපයෙන් බැහැර වීම තුළ බිය නැති වන අතර සහන දායකයාණන් හා ක්‍රිස්තුන් සුවය ගැලවීම යථාර්ථයක් වන්නේ ඒ නිසාය. පාපයෙන්

බැහැර වීම තුළ බිය නැති වන අතර සහන දායකයාණන් හා ක්‍රිස්තුන් වහන්සේ තුළ සිටීම තුළ ප්‍රඥාවත් වරප්‍රසාදී ජීවිතයත් ලැබේ. ඒ නිසා කඳුළු, සතුටු කඳුළු වන්නේද බිය නැතිව ආදරය වටින්නේත් පාවුලු තුමාගේ ලිපිවල ප්‍රකාරය ප්‍රේමය ඉස්මතුවීම වැදගත් වන්නේත් ඒ නිසාය.

**වෛද්‍ය සචිත මෙන්ඩිස්**

**කිතුනු දිවියට කඳුළින් සිනාව**

15 වන පිටුවෙන්.....

නිරය දුටු ෆවුස්තිනා කන්‍යා සොහොයුරිය ඇගේ දිනපොතේ නිරයට යන මාර්ගය පිළිබඳ මෙලෙස විස්තර කර ඇත.

"මා පාරවල් දෙකක් දුටු අතර ඉන් එකක් ඉතා පළල් ය. මල්වලින් පිරී ඇත. එහි ජනතාව ඉතා ප්‍රීතියෙන් කමින්, බොමින්, නටමින් ගමන් කරයි. මාර්ගය අවසානයේ ගිනිදැල් විහිදුවන ඉතා භයානක ආවාටයක් ඇති අතර ගමන් කරන සියලුදෙනාම අන්ධයන් මෙන් නිරය නමැති මේ ආවාටය ඇතුළට ඇද වැටුණාහ. ඒ සංඛ්‍යාව කොතරම් වීද යත් ඒ මිනිසුන්ගේ ගණන ගණන් කළ නොහැකි තරම් විය". නිරය පිළිබඳ ඇය දුටු සම්පූර්ණ විස්තරය අන්තර්ජාලය හරහා

"Vision of Hell by sister Faustina" යන්න පරිගණකයට ඇතුළු කර දැන ගත හැකිය.

කිතුනු අපි සියලු දෙනා අපගේ පියාණන්වන දෙවියන් වහන්සේට පමණක් වන්දනා කරමින් උන්වහන්සේට ප්‍රේම කරමින් කඳුළු පිරුණු මේ කිතුනු දිවිය තුළ ධෛර්යවත් ව ඉදිරියට ගමන් කරමින් සතුට පිරුණු සදාතන ජීවිතය ලබා ගැනීමට භාග්‍යය උදා කර ගනිමු.

# ඔබව රකින්නට පණ වුව දෙන්නට රොද බැඳගන්නවා මෙවර අපි

දහ දුක් විඳ විඳ කඳුළු වගුර ගෙන හාමතෙ සිටි හැටි දන්නේ අපි
වේල් තුනෙන් එක් වේලක් අරගෙන දරුවන්ගේ කුස පිරෙව් අපි
අනේ ඇත්තටම මෙවන් පුතෙක් ගැන හරිහැටි තේරුම් නොගත් අපි
සාපය ඉවරයි රටට හිත කරයි පුනරුදයක් ගැන හිතමු අපි

මට පුළුවන් කියූ වාසි බස්වලට මුළා නොවූ ජනතාව අපි
සීමාවක් නැති පොරොන්දු කීවට නොඇසූ විලසින් සිටියෙ අපි
එහාට මෙහාට ඡන්දය දී ගෙන හැමදාමත් රැවටුණා අපි
ඒ බව හොඳ හැටි තේරුම් අරගෙන පුංචි මිනිහා රජ කරමු අපි

හරි විශ්වාසයි කියන දේ කරයි බලාපොරොත්තුවේ ඉන්නේ අපි
ඒ ගැන සැකයක් නොදැනෙන විදියට ප්‍රබෝධයෙන් කල් ගෙවමු අපි
වංචා, දූෂණ, කොමිස් ගරාගෙන රට කළ අය ගැන බලමු අපි
වැඩිකල් යන්නට මත්තෙන් මේවා එළියට දෙන බලවේගේ අපි

ආරම්භය නම් හරිම අපූරුයි සරල දෙයට ගරු කරමු අපි
උගත් බුද්ධිමත් වියතුන් පෙරටු කොට රට ගෙන යනවට සතුටු අපි
ලෝක නායකයෝ වෙනස පිළි අරන් සුබ පතනවා දැන් දකින අපි
ශ්‍රී ලංකාවට ජයෙන් ජය ගෙනෙන නව ජනපති රැක ගනිමු අපි

රජ සබයේ පුටු හොරුන්ට නොදෙන්න වගකියනා අය වෙන්නෙ අපි
කතිරය වටිනවා සියල්ලට වඩා උගතුන් තෝරමු මෙවර අපි
කිසි දා නොදැකපු වටිනා මිනිසුන් දියවන්නාවට යවමු අපි
ජනපති සිහිනය සැබෑ කරන්නට අත්වැල්බැඳ රට හදමු අපි

ගමක ඉපදිලා ජනදුක හඳුනන නව ජනපති හට ආදරෙයි අපි
ඔබව රකින්නට පණ වුව දෙන්නට රොද බැඳ ගන්නවා මෙවර අපි
ලස්සණ දිවියක අසිරිය විඳින්න මග පාදන හැටි බලමු අපි
මීට වඩා තද ආරක්ෂාවක් ගන්න කියා මොරගසමු අපි

**රූපස් ප්‍රැන්සිස්**



# දුකෙන් උපන් සතුට ( කෙටි කතාව )

"පීටර් ඔයා අපිට ගෙයක් බැලුවද? දැන් සයිමන් මුදලාලි මේ ගේ ඉල්ලලා නෙ තියෙන්නෙ. ඒයෙත් ඇවිල්ලා කෑගහල ගියා".

"මම ගෙවල් කීපයක්ම බැලුව. කුලිය සැරයිනෙ. අපිට ඔරොත්තු දෙන්නත් එපායැ. ඒටත් මාස හයකවත් අත්තිකාරම් ඉල්ලනවනෙ. අපි කොහොමද නෙතලි එච්චර ගාණක් ගෙවන්නෙ?"

"මේ දවස්වල පුදුම වැස්සක්නෙ තියෙන්නෙ. මම ළමයින්ට ඉස්කෝලෙ යන්නත් එපා කිව්වා. ඒත් විභාගෙ ළඟයි කියල ගියා".

"පාරත් යටවෙලා. ටවුමට යන්න වෙන්නෙ වට රවුම් පාරෙන්. ළමයි කොහොම ගියාද දන්නෙ නැහැ. ඉස්කෝලෙ ඇරෙන වෙලාවට මම ඒ පැත්තට ගිහිං බලන්නම්කො".

"අනේ මංදා මේ වැස්ස නිසා ඔයාට වැඩක් වත් ලැබෙන්නෙ නැහැ නේද? මගේ මේ කරාබු දෙකවත් උගස් කඩේ තියල කීයක් හරි ගම්මු. ගෙවල් කුලිය ගෙවන්න තියෙන කාලෙක බේරගන්න බැරියැ".

"බලමු, බලමු, මම තවත් විපරම් කරල බලන්නම්කො. අපි තව මාසයක්වත් කල් ඉල්ල ගම්මු. මේ වැස්ස පොඩ්ඩක් අඩු වෙන්නත් එපායැ බඩු ටික අදින්න".

"ඔව් අනේ කියල බලමු. බඩු කියල මහ දෙයක් නැනෙ. ඇඳයි, පොඩි අල්මාරියයි, මේසෙයි, කුස්සියෙ බඩුයි විතරනෙ. වටිනා දේකට තියෙන්නෙ ළමයින්ගෙ පොත් පත් තමයි".

"සයිමන් මුදලාලි අපිට කල්දෙයි. එයා නරක මිනිහෙක් නෙමෙයි. අපේ පල්ලියෙ අලුත් වැඩියාව සම්පූර්ණයෙන්ම එයානෙ කරන්නේ".

"ඔව් ඔව් පුතාලගෙ ඉස්කෝලෙ ගොඩනැල්ලකුත් හැදුවලු. එයාගෙ නම ගහල තමයි විවෘත කරල තියෙන්නෙ".

"මම හෙට දිහාවට මුදලාලි මුණ ගැහිල කථා කරන්නම්කො " කියා පිටර් පිටත්ව ගියේය. නෙතලි සහ පීටර් දරු තිදෙනෙකුගේ දෙමාපියන් ය. දරුවන් පාසැල් ගිය පසු නෙතලි අසල ගෙවල් කිපයකට අත් උදවු දී යම් කිසි මුදලක් උපයා ගනී. සමහර දිනවල කෑමට බීමට යමක්ද ඒ ගෙවල්වලින් ලැබෙයි.

මනහර කඳු ගැටයක් පාමුල කුඩා නිවසක කුලියට ඔවුහු වාසය කරති. ඒ නිවස අයිති ගමේ වැදගත් පොහොසත් දානපති මුදලාලි කෙනෙක් වන සයිමන් මුදලාලිටය. ඒ නිවස කඩා දමා එතැන නව නිවසක් සෑදීමට මුදලාලි සිතා සිටී. ඒ නිසා මේ නිවස පීටර්ලාගෙන් ආපසු ඉල්ලයි.

එදා දහවල් වනවිට පීටර් පැමිණියේ ගෙවල් කිපයක් පිළිබඳ ආරංචි රැගෙනය. ඒ ගැන සිය බිරිය සමග කතා කරමින් සිටින අතර සයිමන් මුදලාලි පැමිණියේය. ඔහු සමග නාඳුනන පුද්ගලයෝ දෙදෙනෙක්ද වූහ.

"මුදලාලි එන්න එන්න ගෙට" කියමින් පීටර් ගෞරව පෙරදැරිව හිස නවා මුදලාලිට කතා කළේය. එහෙත්

"මට ගෙදරට එන්න වෙලාවක් නැහැ. මම ආවෙ හෙට උදේ දහය වෙනකොට මට මේ ගේ අවශ්‍යයයි කියන්න".

"අනේ මුදලාලි මම එන්න හිටියෙ තව මාසයක් වත් කල් ඉල්ල ගන්න. ගෙවල් වලට හය මාසයකවත් අත්තිකාරම් ඉල්ලනවා. ඉතිං මේ දුප්පත් අපිට හරි අමාරුයි ඒවා ගෙවන්න".

"ඔව් ඔව් ඒවා අමාරු තමයි. උඹල මේ ගෙදර නිකං වගේනෙ ඉන්නෙ. බැහැ බැහැ තව කල් දෙන්න බැහැ. හෙට උදේ වෙනකොට මට මේ ගේ හිස් කරල ඕනෙ. නැත්තම් ජේනවනේ ; මෙයාලා එයි බඩුටික ඇදල දමල ගේ කඩන්න පටන් ගන්න". "අනේ මුදලාලි තව සුමානයක් වත් කල් දෙන්න" යයි ඉතා බැගෑපත් ලෙස පීටර් අයැදීය.

"කතා කරන්න එපා හෙට උදේ දහය වෙනකොට මගේ මේ ගෝලයෝ එයි. ඒට කලින් ගියොත් හොඳා"

"අනේ මුදලාලි....."

"කතා කරන්න එපා මම කිව්වොත් කිව්වා.

හෙට උදේ ගේ කඩනවා" කියා තර්ජනය කර මුදලාලි ගෝලයන් දෙදෙනා සමග ආපසු ගියේය.

"අනේ පීටර් අපි මොකද කරන්නෙ? " කියමින් නෙතලි හඬන්නට විය.

"කරන්න දෙයක් නැහැ මේ තියෙන දෙයක් අරගෙන කොහේට හරි යමු. ඔයා ඔය බඩු ටික සූදානම් කරගන්නකො. ළමයි ආවම එයාලගෙ පොත් පත් ඇඳුම් ටික ලෑස්ති කර ගන්න කියන්නකො. අපිට කළුගල්වල ඔලුව ගහගන්න බැහැනෙ. මම බලන්නම් තව ගෙයක් සොයලා. බැරි උනොත් අපේ නංගිගෙ හරි ඔයාගෙ අක්කගෙ හරි ගෙදර සුමානෙකට ඉන්න බලමු".

"අනේ මන්ද පීටර් අපිට මොකද මේ උනේ ? දරු පැටව් එක්ක මේ වැස්සෙ පාරට බහින්න තමයි වෙන්නෙ".

"නෙතලි අඬලා හරියන්නෙ නැහැ. දැක්කනෙ අර මිනිස්සු දෙන්න. මම හිතන්නෙ උන් ටවුමෙ ගණං කාරයෝ. ළමයි ආවම ලෑස්ති වෙන්නකො. කොහේවත් බැරි උනොත් දවස් කීපයකට පල්ලියෙ වත් ඉඩක් ඉල්ල ගම්මු. අපේ සුවාමි අපිව පන්නන්නෙ නැහැ. මම බලලා එන්නම්කො" කියා පීටර් පිටත්ව ගියේය. නෙතලි කඳුළු පෙරමින් වහ වහා බඩු මුට්ටු පොදි බැඳීමට පටන් ගත්තාය. ඒ අතර ළමයි ද පැමිණියෝය. ඔවුහුද තම තමන්ගේ බඩු අස් කිරිමට පටන් ගත්තෝය. කඩවල්වලින් ඉල්ලා ගත් කාඩ්බෝඩ් පෙට්ටි තිබූ බැවින් බඩු අස් කිරීම පහසු විය. සවස් වෙද්දී පිටර් පැමිණියේ අත් ටැක්ටරයක්ද සමඟය.

"හරි හරි පොඩි ගෙයක් ලැබුණා. අත්තිකාරම් අවශ්‍ය නැහැ කිව්වා. මාසෙ කුලිය ගෙවන්න කිව්වා. මේ ගෙදරට වඩා පොඩියි. කාමර දෙකයි, කුස්සියයි, පොඩි සාලෙයි. ඇතිනෙ. පාරටත් කිට්ටුයි. මෙයාලගෙ ඉස්කෝලෙටත් ළඟයි. ගාණ නම් ඉතිං ටිකක් සැරයි. ඒත් ඉතිං මොනව කරන්නද? "

"අම්මෝ ඇති, ඇති. මගේ ඇඟට පණ ආවෙ දැන් තමයි. මම ගැහි ගැහි හිටියෙ". පීටර් ඉක්මනින් ලී බඩු ගලවා ටැක්ටරයට පැටෙව්වේය. ටැක්ටරයේ රියදුරු මහතාද සහාය විය. ළමයි සහ නෙතලීද අනික් බඩු පැටවූහ. සැමදෙනාගේම උත්සාහය නිසා නිවස හිස් වීය.

"මට නම් දුකයි මෙතන දාල යන්න. පුංචි කාලෙ ඉඳන් හිටපු තැන. හරි ලස්සණයිනෙ මෙතන". එක දරුවෙක් කීවේය. "අනේ ඔව් උදේට කන්ද උඩින් ඉර පායනකොට පලාතම ලස්සණයි". තවෙකෙක් කීවේය. "උදේට ඉර පායනව මෙයා දකින්නෙ හීනෙන් වෙන්නැති. හැමදාම ඉර පායන වෙලාවට මෙයා හොඳටම නිදි". යනුවෙන් තව දරුවෙක් සමච්චල් කළේය.

"හා හා ඔය දැන් රණ්ඩුවක් පටන් ගන්නයි යන්නෙ. ඉක්මන් කරන්න. ආයෙ වැස්සක් එන්න කලින් යන්න ඕනෙ. බඩු බාගන්නත් ඕනෙ. මුදලාලිට යතුරු බාර දෙන්න එන්නත් ඕනෙ". "එපා එපා තාත්තෙ යතුරු දෙන්න. යතුරු හංගලා යමු". "හා හා මේ ඔයා තාත්තා වෙන්න එපා. අපි සැහෙන කලක් මේකෙ හිටියනේ. කිසි කරදරයක් තිබුණෙ නැහැනෙ. යන එක හොඳින්ම යමු" අම්මා තදින් කිවාය. සියල්ලෝම ටැක්ටරයේ නැගී පිටත්ව ගියෝය. අලුත් නිවස තුළට බඩු බාහිරාදිය ද දමා ගත්තෝය.

"වැස්සකට කලින් බඩු ටික බාගත්ත එක ලොකු දෙයක්". පීටර් කියත්ම නව නිවසේ අයිතිකරු පැමිණියේය. "මම ඉතිං පීටර්ව අඳුරනවනෙ. මට අත්තිකාරම් අවශ්‍ය නැහැ. මාසෙ අන්තිමේ නොවරදවා කුලිය ගෙවන්න කො. හදිස්සියේ නිසා ගෙදර තීන්ත ටිකක්වත් ගෑවෙ නැහැ. මම තීන්ත ගෙනත් දෙන්නම් පීටර්ට පුළුවනිනෙ ගාගන්න". "පුළුවනි මහත්තය. මම ගාන්නම්. කැඩිච්ච තැන් වලට පොටි ටිකකුත් ඇදලම ගාන්නම්කො". "හොඳයි එහෙනම් බඩු ටික අස්කර ගන්නකො. මම යනවා". කියා ඔහු පිටත්ව ගියේය.

රාත්‍රිය එළඹෙත්ම වර්ෂාවද අලුත් විය. ගිගුරුම් සහිතව තදින් වහින්නට විය. මොවුන් ජනෙල් දොරවල් වසා ගෙතුළට වී සැනසුම් සුසුම් හෙළුවෝය.

නෙතලි සහ පීටර් රාත්‍රී ආහාරය සූදානම් කරන අතර ළමයි තම තමන්ගේ වැඩ කටයුතුවල යෙදුණාහ. මහ වැසි මැද ඔවුහු කාබී නිදා ගත්තෝය.

විශාල හෙණ හඬක් වැනි ශබ්දයකින් පීටර් පිබිදුණේය. "මොකද්ද අප්පා ඒ සද්දෙ? මහ විශාල සද්දයක් අකුණක් වගේ. කොහාට පාත් උණාද දන්නෙ නැහැ".

නෙතලීද ඇහැරුණාය. ඇය නැගිට දරුවන්ගේ කාමරය දෙස විපරම් කර බලා නැවතත් නිදි පැදුරට ආවාය. තද සුළඟත් මහා වැස්සත් වට පිටාවේ පිරී තියෙද්දී ඔවුන් සැනසීමෙන් නිදාගත්තෝය. පසුවදා හිමිදිරි පාන්දර ඔවුන් අවදි වූයේ මිනිසුන්ගේ කෑකෝ ගැසීම නිසාය. ඔවුහුද නිවසේ දොර ඇරගෙන එළියට අවෝය. බෝහෝ දෙනකු කඩිමුඩියේ දුවනු පෙනින. පීටර්ද එදෙසට දිවීමට සැරසී, "මම බලාගෙන එන්නම් කාට හරි කරදරයක් වෙලා වගෙයි. ඔයාල ඉන්න" යයි කිව්වේය.

සැම දෙනාම දුවන්නේ තමන් සිටි පරණ ගෙදර දෙසට බව දුටු පීටර් ද එදෙසට දිව්වේය.

"අනේ මගෙ අයියේ මගෙ අයිය ඉවරයි. අනේ දරුපැටවු ටිකයි ඔක්කොම ඉවරයි".

කියමින් පීටර්ගේ නැගණිය හිස අත් බදාගෙන දුවනු පීටර්ට පෙනිණ. පීටර්ද කලබලවී

දුවගෙන ගියේය. අවසානයේ ඔහු දුටු දෙයින් ඔහු තුෂ්නිම්භූත විය.

"දෙවියනේ අපි බේරුන බේරිල්ලක්" කියමින් සිටි තැනම බිම දණ නමා

"මගෙ දෙවියනේ අපේ ජීවිත බේරුණා. මේක නම් හාස්කමක් අනේ දෙවියනේ ඔබ වහන්සේ අපිව බේරගත්තා"

කියා කෑගසමින් වැඳ වැටුණේය. ඒ සමගම නෙතලි සහ දරු තිදෙනා ද ආරංචිය ලැබී දුවගෙන පැමිණ තිබුණි. නෙතලි ඉකිබිඳ හඬමින් තම නැගණියව බදාගෙන සිටින අයුරු පීටර් දුටුවේය. ළමයි කථා කරගැනීමට වත් නොහැකිව විස්මපත් වී බලා සිටියෝය.

පීටර් ලා සිටි නිවස පිටුපස තිබූ මනරම් කඳු ගැටය ගල් බොරලු සමගම නාය ගොස් ඇත. එතැන නිවසක් නොව පස් කන්දක් බවට පත්වී තිබුණි.

නෙතලි පීටර් සහ දරු තිදෙනා එක පොදියට තුරුලු වී සැනසුම් සුසුම් හෙළුවෝය. ඒ සමගම නෙතලීගේ අක්කාද හඬාගෙන දුවගෙන ආවේය. පීටර්ලා දුටු, රැස්ව සිටි සැම දෙනම සැනසුම් සුසුම් හෙළුවේය.

පෙරදින දුකෙන් වේදනාවෙන් හැඬූ කඳුළු අද සතුටු කඳුළු වී ගලා ගියේය.

**ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න**

# කුරුළු පවුල



එක දවසක් මා දැක්කා
කුරුලු ජෝඩුවක්
කෝටු කැලි තුඩෙන් ගෙනෙනවා

මගේ ගෙදර වත්ත කොණේ
දොඩම් ගහේ ගස් දෙබලක
කූඩුව හදනවා දැක්කා

ලස්සණ පොඩි කුරුලු කූඩුවක්
දෙන්නම හැදුවා


කූඩුව ඇතුළේ පුංචි කිරිල්ලී
ඉඳගෙන හිටියා
පුංචි කුරුල්ලා
ගී ගයමින් නැටුවා
දින දින ගෙවුණා
මම කන් දුන්නා
කිචි බිචි හඬ නැගුණා

කුරුලු පියා කෑම ගෙනාවා
වටේ කැරකි කැරකි
පැටවුන් හට කැව්වා

පුංචි පැටවු කිචි බිචි ගෑවා
මවයි පියයි ගී ගැයුවා
හරිම ලස්සණයි කුරුලු පවුල
හරි සතුටුයි අප සැමටම

**දිමිත්‍රි යොහාන් ප්‍රනාන්දු**
5 වසර - ශා. ජෝසප් විදුහල, මරදාන.

# රෑ වැටුණොත් වළේ ...




දුක අයිති අපි සැමට
සතුට විතරක් තිබුණෝ
අපි කතිරේ දුන් උන්ට
විලි ලජ්ජ නෑ අපිට
හැත්ත හය වසරක්ම
ලිං පතුලේ උන්නාම
ලිං මැඩියො තමයි බං
වෙන ලොවක් නෑ අපට
ප්‍රතිඵලය  බැලුවාම
ඡන්ද අයිතිය මොකට
මට අයිති මගේ ගෙල
තදින් මිරිකා ගන්න
පාට පක්ෂ නෑ උන්ට
ඒවා තිබුණෙ අපට
රෑ වැටුණු වළේ යළිත්
දවල් නොවැටී ඉන්න

චමත් බී. පයාගල
කටුකුරුන්ද කළුතර

## අමිතගේ හද ගැස්ම......



# MODERNIZING SUNDAY SCHOOLS

Rev. Fr. Eric Lakman OMI

The Catholic religious education, carried out through Sunday school system, is also a part of the universal education system. The English word education derives from the Latin word educare which means bring forth or draw out. Hence, Socrates understood education as 'bringing forth ideas of universal value'. For Aristotle 'education is the cultivation of the mind and character'. Plato perceived education as 'a means of character development'. Mahatma Gandhi defined education as 'all-round drawing out of the best in child'. John Dewey understood education as 'the process of the reconstruction of experience'. Hence, Catholic religious education also must help in bring forth / drawing out 'the God-likeness hidden in the students.' In fact, God created humanity in His likeness and invited them to become God-like people (Gen. 1:26-27).

As it was understood in the last century, education comprises of three components: providing information/ knowledge, developing skills and forming values. However, according to the modern educationists', education involves four elements: developing students' analytical abilities, life skills, sense of morality and critical thinking. Analytical abilities include the skills of identifying problems, explore to find out related facts and find logical solutions. Critical thinking involves asking proper questions, analyse situations, interpret – evaluate facts and making judgments about what students read, hear, say and write. Moral sense is about the ability to determine the rightness or wrongness of one's thoughts, speech and actions according to the teachings of Jesus Christ. Modern education tries to develop in children life skills such as collaboration, creativity, nonviolent communication, global awareness, leadership, social responsibility, relationship skills and responsible decision making. Modern education is life-oriented rather than head-centered.

Catholic Sunday School system still follows the old understanding of education. Hence, it mainly focuses on providing information and prepares students for competitive standard examinations. Today it is important that Sunday school system becomes life-oriented and follows the modern understanding of education and incorporates in its system the four elements of modern education. It is vital that Sunday School too uses analytical abilities, critical thinking and life skills and forms students in the Catholic sense of morality.

How to go about (methodology) … Let us take the catechism of the famous Parable of the Workers in the Vineyard (Mt. 20:1-16). Having got the students to read the parable in a participatory manner (number of students taking part in reading the parable), Sunday school teachers could provide students with basic biblical background to the parable. Then, help the students to analyse it in the light of Catholic faith (depending on their level). Teachers could ask the students to identify the main characters of the parable. Help students to be critical within the Catholic faith tradition and Catholic social teaching and help them to ask some basic questions such as why some labourers were hired and others were left behind? Why daily wage a denarius? What made the landlord decide

to pay everyone a denarius? Why other workers were angry when the landlord gave every one a denarius? Encourage students to ask these critical questions with in 'faith seek understanding' framework and lead them to discuss them in small groups and to present their findings in the class. That way teachers could help students to develop their analytical skills, critical thinking and Biblical imagination.

Provide the information to the students that a denarius is a daily wage of a person at that time. Tell them that every dad has a duty to feed the family irrespective of whether he gets employed or not. This dad too, though he got employed at the last hour, has to have a denarius to feed his family. That is why the landlord gave the man employed at the last hour also a denarius. Explain the symbolism used by the evangelist – God is the landlord in the parable.

Tell the students that God is concerned about the wellbeing of every family; that God is concerned about all the worried dads; troubled mothers; hungry children. That way, teachers could help the students to recognize the moral values the landlord upheld: such as empathy, care taking, collaboration, creativity, and life skills he demonstrated such as nonviolent communication, leadership, problem solving, social responsibility, relationship skills, responsible decision making, etc. By critically analyzing the parable with students, teachers could develop the Christian moral sense in students and help them to appropriate these values in their lives and become God-like persons.

Sunday school education needs to move away from formal, competitive, examination-oriented, memory-based old system and embrace modern understanding of education. It needs to incorporate the modern understanding by use of analytical abilities, life skills, sense of morality and critical thinking. Religious education, as a part of universal modern education, needs to be more life-oriented rather than mere information gathering cum passing exam system.

## හමුවෙති... සමුගනිති...

ජීවිතය දුවන කෝච්චියකි
සමහරු ගොඩ වෙති සමහරු බැස යති
සමීපයන් බැස යන විට සංවේගයකි
දැනෙයි වේදනා හද සන්තානේ
තනිකමක්, පාළුවක්, හිස් තැනක්ද එහි ඇත.
බැසයන ඔවුන් දෙස බලා සිටිමි
නිමේෂයකින් ඒ අය නොපෙනී යති
සමහරු කිසිදින යළි හමු නොවෙති
එය මහත් වේදනාවකි
එහෙත් එය කෝච්චියේ යථාර්ථයයි
ඔබද කෝච්චියෙන් බැස ගියේ දැයි
මම විමසමි
එය එසේ නම් අකමැත්තෙන් වුවද පිළිගනිමි.
මන්ද, සියල්ල වෙනස්වන ලෝකයේ
කෝච්චියෙන් ගමන් කරන්නනෝද වෙනස්
වෙති
මට සමීප වූ මා ඇසුරු කළ
බොහෝ ආදරණීයයන් කෝච්චියෙන්
බැසගොස් ඇත
ජීවිත කෝච්චියේ තවදුර යායුතු බව දනිමි
බැසයන ගොඩවන අය දෙස මම
උපේක්ෂාවෙන් සන්සුන්ව සංවරව බලා සිටිමි
ගමන නිමවන දුම්රියපොළ එනතුරු ...

නිර්මාණය - **C J E D**

# අතිනත ගත් දවසේ සුබ නත්තල් සුව හිමිවිය

දෙව්මවගේ වෙනස දුටුව මුනිඳුන් හට     සංජුසේ
දරාගන්න හැකි වෙන්නට ඇතිදැයි නොදනිමි  කෙසේ
ගිනි කබලක් තැබුවා වාගේ වෙන්නට ඇති  හිසේ
නම්දී සිටියදී සරණ පාවා ගන්න     ලෙසේ

ප්‍රසිද්ධියේ නිගා නොකර මනාලියට මුනි     තුමා
කළේ තීරණය යන්නයි රහසින් අතහැර     දමා
සත්පුරුෂ බව තුළම සිටියදී සුව දෙන     අමා
රෑ සිහිනෙන් දුටු නොසිතූ ලෙස ගැටලුව විය  නිමා

යහන්ගතව සිටි එක මොහොතකදී මුනිඳුන් සොයා
දෙව් පිය පණිවුඩය රැගෙන පැමිණිය සුර   දූතයා
කීවම ඇය භාරගන්න බිය නොවන්න යැයි   කියා
දෙව්මව් කුස දැරූ පුතුට හමුවිය සුරැකී     පියා

අකරතැබ්බයක් මෙවැනි වීනම් අපි     දෙන්නට
මොනවිධියේ දෙයක් වෙයිද පෙර අතිනත ගන්නට
සාරිය නොව ගවුමක් ඇන්දත් සැම    රවටන්නට
මංගල දිනදී බැරිවෙයි නිසැකව     සැනසෙන්නට

මෙලොවින් සමුගත් ඔබගේ පියසඳුගේ   හැඩරුව
ලෙසටම යහගුණ සැවොම දුටිමි තිබෙනු  උරුමව
රන්මිණිමුතු ඒවා විය මුළුදිවිපෙත     සැරසුව
කීය මගෙන් ඔයාට ඒ පියාව හමුවූ     බව

මංගල යෝජනා නොමැත අපහට අඩුවක්  වුණේ
එනමුත් ඒ කිසිවක් ළඟ නෑ සිත් මල්     පිදුණේ
අපදෙදෙනා හට අප දෙදෙනා පමණයි   පැහුණේ
එදා වින්ද සැනසුම ඒ ලෙසටම තවමත්     දැනේ

දසවසරක් සිටින විටදි ආදරයෙන් පණ     පෙවී
තුරුලට ගෙන රසවිඳගනිමින් මා පබැඳූ     කවී
ගෙවූකමට හැමමොහොතකම හැඟුමට මහ නොවී
සුරතුති නද නැගුණි දිවිගමනට නොගොසින්  නිවී

මව්පිය ආසිරි වාදය අප ලැබගෙන     සිටියදී
ගියහැටි මතකයි හැමතැනකම නොවෙනා ලෙස මදී
ඔබ රැකගත් කමට අපේ චරිත කැළැල්වනු  නොදී
උදාවිය සුබනත්තල අතිනතගත්     දිනයෙදී

**පස්කල් ජයමාන්න**
උස්වැටකෙයියාව.

# ...කඳුළයි සිනහවයි...

කඳුළයි සිනහවයි එක් වී තිබුණේ ජේසු කුරුස බරින් ගිය  කල්වාරි ගමනේ
ජෙරුසලම් වැසියන් කඳුළු සලමින් වැලපුනේ බෝහෝ ජනයන්  සමගිනේ
සතුරු ජුදයන් සිනාසෙමින් නට නටා ගියේ ජේසුට දස වධ     කරමිනේ
එදාටත් වඩා අද කඳුළු සැලෙනවා සිනා මුසු මුහුණු කාගෙත් නොපෙනුණේ

සිනා සෙන්නට පුළුවන් මොනදේද මොනවාද රට තුළ     කෙරෙන්නේ
රැකියාව නැතුව ඇඬූ කඳුළින් කන්න නැතිව බොහෝ ජනයා  බඩගින්නේ
මෙහෙම රට ගියොත් සිනහාව නොව කඳුළයි රට තුළ     රජවෙන්නේ
එහෙම් රට තුළ ජීවත් වෙන්න බැහැ පුළුවන් අය පිටරට     පැනගන්නේ

රට තුළ හරිදේ කෙරෙනවා නම් හරියට කඳුළු පිරෙන්නේ නැහැ     ඇසට
සැම හදවත් තුළ ඇති දුක් කරදර හඳුනා ගන්නට බැරි නම් කොයිදැයි සතුට
මේ සතුට නැති තැන කොතනකවත් තිබේද අප හට හිනහාව දැක  ගන්ට
එකෙකු සිනාසෙන විට බොහෝ දෙනෙකු කඳුළු සලනවා ඇත පෙනෙන්නට

පොල් දෙල් කොස් පලතුරු බව බෝග ඇති අය හට නොදැනුණත් බඩගින්න
ඒ සැම අය ළඟත් බහුලව තිබෙන්නෙ සිනහාව නොව කඳුළයි  දැනගන්න
රට තුළ වගාවන් නැති කළහොත් අපෙ මහ මොළකරුවන් බල සම්පන්න
කඳුළු සලන්නට නොව සිනා නගන්න නොව බඩගින්නේ පුළුවනි මියැදෙන්න

එන දුක් කරදර විඳ දරාගන්නට කාටත් ධෛර්ය ශක්තිය     තිබුණෝතින්
මේ ධෛර්ය ශක්තිය නැති වෙනවා කාගෙත් අගහිඟතාවය වැඩි උණෝතින්
සැම කෙනෙකුගෙම අතමිට සරුවී කරනා වැඩපල හරියට  කෙරුනෝතින්
කඳුළක් නැති සිනාවෙන් පිරි හදවත් අපි සැමදෙන ඉදිකරගමුද     ඉතින්

**පී.ඩබ්ලිව්. සුනිල් ප්‍රනාන්දු**
35/17 සාන්ත අන්තෝනි පෙදෙස
වෙරළ පාර, වාද්දුව.



# ඕං එහෙනං



## ඉසිකෝමානය තුරන් කළොත්...

දුක දැනෙණා විට නෙතඟින් ගලනා දිය දහරා බඳු උණු කඳුළු
ගලා ගලා ගොස් හදවත් හඬවන රිදුමක් ගෙන දෙන උණු කඳුළු
කවුරු කොහොම කෙලෙසින් සිදුවන්නේ දැයි කිසිවකු නොදන්න උණු කඳුළු
දුකට වාගෙමයි සතුටට ඇස්කොනේ අග දිදුලන සතුටේ කඳුළු

කඳුළු කතා නම් එමටයි අතීත සිතුවම් බොඳ උණා ලෙසේ
කන්නට බොන්නට අකුරු කරන්නට හැකිනං තැන කෙලෙසේ
අම්මා මරාන පරමවි සොයාන කරදිය වළල්ල ඇත්තේ කෙලෙසේ
සිතු දේ නොව වේ නොසිතූ දෙයක්ම විය ජීවන මග ගැලුවේ කෙලෙසේ

අරුණාලු වැටුණා හද මල් පිපුණා අනාගතේ මං විවර වුණා
කඳුළැලි පිසදා හසරැලි නැගුණා ජය බෙර හඬ තීව්‍ර වුණා
සමානතාවයි මානව දයාව රජකුල විසිරී ජනරජ රජ කෙරුණා
රට පොහොසත් කර කඳුළින් සිනහව ජය ගත්තා බව පසක් වුණා

ඉසිකෝමානය තුරන් කළොත් හද සිනහව මුවගට දිව එන්නේ
ඒ සිනහවෙන් ලොව ලස්සණ වන බව ඉරහඳ සේ තිර වන්නේ
කාසිවලට ගන්නත් බැරි කාසිවලට දෙන්නත් බැරි සිනහව ලොව දින වන්නේ
එවැනි සිනහා පොදි බෙදා හදා ගෙන ජීවිත ලස්සණ කරපන්නේ

සිනා පොකුරකට කඳුළු ගඟක් වියළිය හැකිබව සිතපන්නේ
හඬමින් කඳුළෙන් නිති ළතැවිල්ලෙන් පලක් නොවනබව සිතපන්නේ
සතුටු සිනහ මල් මිටක් රැගෙන් දුක් කඳුළු පිස දාපන්නේ
මිනිස් බව අගේ කරමු අපි සිනහ කඳුළු හැරදා පන්නේ

මරණය කඳුළක් නොව සගයෙ දොරටුව බව සිහි කරපන්නේ
කඳුළක අවසන සිනාව පොදි බැඳ ගමන් කරන බව සිතපන්නේ
මළවුන් සිහිකර නොවැම්බරේ එන මරණය ගැන සිහි කරපන්නේ
දෙසැම්බරේ අපි නත්තල සිහිකර සාම සිනා රැලි පතුරන්නේ

සූරිය මාමා

# පුංචි විකුම්

# ළමා ප්‍රබෝධනය



## තායිලන්තයේ පාසල් ගුරුතුමිය...

ඔක්තෝම්බර් පළමුවෙනිදා අපි ලෝක ළමා දිනය වගේම වැඩිහිටි දිනයත් සමරනවා. දරුවන් වගේම වැඩිහිටියනුත්, මේ දෙපාර්ශ්වයේම සම්බන්ධතාවත් ලෝකයේ පැවැත්මට කොයිතරම් වැදගත් ද කියල තමයි අපි මේ දවසෙදි විශේෂයෙන් සිහිපත් කළ යුත්තෙ.

ආදරය, රැකවරණය, ඇගයීම ලබා දෙමින් ළමා ලොව අර්ථවත් කරන්නට දායක වන්නෙ වැඩිහිටියන්. ඒ වගේම තමයි වැඩිහිටි වියට ආදරය, සතුට, සැනසුම එක්කරමින් වැඩිහිටි ලොව අර්ථවත් කරන්න දායක වෙන්නෙ දරුවන්. ලෝකය පවතින්නේ මේ ගැඹුරු ආදරය සහ අන්‍යෝන්‍ය සහජීවනය මත.

මෑත කාලයේ ලොව බොහෝ දෙනකුගේ හදවත් සසල කළ සිදුවීමක් තමයි තායිලන්තයේ පාසල් දරුවන් පිරිසක් රැගත් බස් රථයට සිදු වූ හදිසි අනතුර. බස් රථය ගිනි ගැනීම නිසා එහි සිරවුණු දරුවන් විස්සක් පමණ ජීවිතයෙන් සමුගත්තා. මේ සිදුවීමත් එක්ක වැඩි වශයෙන් කතාබහට ලක්වුණා ආසන්න සමයක තමන්ගෙ සරසවි ජීවිතය නිම කළ පාසල් ගුරුතුමිය දරුවන්ගේ ජීවිත රැකගන්නට දැරූ වෑයම.

සොඳුරු තාරුණ්‍යයේ සිටි ඇය තමන්ගේ ජීවිතය ගැනවත් නොසලකා පුංචි පැටවුන්ගෙ ජීවිතය රැක ගන්න වෙර දැරූ බව ඇසින් දුටු සාක්ෂි තියෙනවා. අවසානයේ ඇය තමන්ගෙ ජීවිතය පූජා කරන්නෙත් දරු පැටව් ටිකක් තුරුලු කරගෙන.

ජීවිතය සහ මරණය අතර ඇත්තේ කෙබඳු සම්බන්ධතාවක් ද නොවැම්බර්, එසේත් නැත්නම් මළවුන්ගේ මාසයේ දී අපි ඒ ගැන වඩාත් ගැඹුරින් මෙනෙහි කරනවා. මරණයට පවා අර්ථයක් ලැබෙන පරිදි ජීවත්වීම වඩා වටින බවයි අපිට ජේසුස් වහන්සේ පෙන්වා දෙන්නෙ. තායිලන්තයේ පාසල් ගුරුතුමියත් අපට පෙන්වා දෙන්නෙ ඒ පාඩම ම තමයි.

ආදර දුවේ පුතේ, හදිසි අනතුරු කොයි මොහොතේ කොතැන ඇතිවේදැයි කියන්නට බැහැ. අපි හැමවිටම සැලකිලිමත් විය යුතුයි අපගේත්, අපේ මිතුරු මිතුරියන්ගේත් සුරක්ෂිත බව ගැන. අපි නිතර දකිනවා නොසැලකිලිමත්, අවදානම් ගමන් නිසා ජීවිතයෙන් සමුගන්නට සිදු වූ දරුවන් ගැන. කල්පනාකාරී වූවා නම් ඒ අනතුරු වළක්වා ගත හැකිවන්නටත් තිබුණා.


පුංචි කාලයේ වීර වික්‍රම ක්‍රියාන්විතවලට අප බොහොම කැමතියි තමයි. ඒත් වීර ක්‍රියා කරන්නට පෙර අවදානම් ගැනත් සැලකිලිමත්ව ආරක්ෂිත වීම වැදගත්. තායිලන්තයේ පුංචි පාසල් දරුවන්ට තමන්ගේ ජීවිතය රැකගන්නට වැඩි දෙයක් කරන්නට ඉඩක් නොතිබුණු බව ඇත්ත. ඒත් අපේ තරුණ දරුවන් බොහෝ විට අනතුරුවල වැටෙන්නෙ දෙමව්පියන්ට, පාසලට රහසින් යන ගමන් බිමන් නිසා.

පුංචි වීරයන් වෙන්නේ යහපත් චේතනාවෙන් යහපත් දේ කරන දරුවන්. අනවශ්‍ය වීරකම් වෙනුවෙන් තමන්ගෙ ජීවිත අනතුරේ දාගැනීම නම් වීරකමක් නෙවෙයි. මරණය සහ ජීවිතය ගැන ගැඹුරින් මෙනෙහි කරන නොවැම්බර්, දෙසැම්බර් මාසවල මේ ගැනත් හිතන්න.

තරු නැන්දා



## ප්‍රහේලිකා අංක - 82



**පහළට**

1. අපගේ විරුද්ධකාරයා.
2. "තෙක්" යන්නට සමාන අරුත් දේ.
3. ඕස්ට්‍රලියාවේ හොඳම ආර්ථිකයක් සහිත ප්‍රාන්තය.
5. කරත්තවලට ගෙන යන ලාම්පුවක්.
6. අං ඇදීම ආදී ක්‍රීඩාවල කණ්ඩායම් දෙකින් එකක් හඳුන්වාදෙන පාරම්පරික කම.
9. උඩරට නර්තනයේ විශේෂ අංගයකි.
10. ගුහාව.
11. හදිසි අනතුරකින් ශරීරයේ ඇතිවේ.
12. වනයේ ගස්වල බැඳි මී වලින් ලබාගන්නා පිරිසිදු මී පැණි.
13. "අඩු" යන්නට සමානය.
17. ශු. ජුසේ වාස් පියතුමාගේ කුරුසිය තැන්පත් කර ඇති ගම.
18. "සතුට" සමාන පදයකි.
19. ගස්වල සහ වැල්වල මුල්වල ඇතිවේ.
20. "දැල" යන්නට සමාන අරුත් දේ.
21. ජලයේ උපන්.
22. 10 ට අඩු සංඛ්‍යාවකි.
23. සංඝයා වහන්සේ විසින් දෙනු ලබන ධර්මානුශාසනාව.
24. දුර බෙදීම කාලයෙන් ලැබෙනුයේ ......

**හරහට**

1. දුකෙහි විරුද්ධ අර්ථය.
4. ලෝකයේ සතුටින්ම ඉන්න ජනතාව ඇති රට.
7. ණය ........... යුගල පදයකි.
8. පුරාණ සිංහල ක්‍රීඩාවකි.
10. මාක්ස්වාදයේ ප්‍රධානයෙකි.
11. ලංව පිහිටි ගස් සමූහයකි.
13. ථේරවාදී බුදු දහමට භාවිත වන තවත් නමකි.
14. කුරු/මිටි යන්නට සමානය.
15. වම් අතේ අල්ල.
16. ඖෂධීය වටිනාකමක් හා දේශීයව ඉතා වැදගත්කම ඇති නිරතුරු ඔක්සිජන් පිට කරන ගස.
20. ශ්‍රී ලංකාවේ නව ජනාධිපතිවරයා පත්වූ දේශපාලන පක්ෂය.
25. සංගීතයට සම්බන්ධයි.
26. ලුණු සමාන පදය.
27. "ගන්න" යන්නෙහි උත්තම පුරුෂ බහු වචන පදය.
28. කොඩියට සමාන පදය.
29. ගැනුම්කරුගේ ඉල්ලීම පරිදි ගෙවීම සහතික කිරීම සඳහා විකුණුම්කරු වෙත බැංකුව නිකුත් කරන ලිපි.

**ගරු චාමික සුදර්ශන නිමනි පියතුමා**
මැසනඩ් ඉංග්‍රීසි අධ්‍යාපන ආයතනය
කටුවපිටිය, මීගමුව.

ප්‍රහේලිකාව සඳහා ඔබගේ පිළිතුරු තැපැල්පතක පමණක් අලවා පහත ලිපිනයට, 2024 නොවැ. 30 ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් කුසපත් ඇද තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙලින්, රු.2000.00, රු.1500.00, රු.1000.00** බැගින් පිරිනැමේ. ***විශේෂ මතක් කිරීමක් - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.***

**ප්‍රහේලිකා අංක - 82**
**"ළමා භක්ති ප්‍රබෝධනය", අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.**

## ප්‍රහේලිකා අංක 80 - පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 ජ | ත් | 2 ද | බ | 3 ල | 4 ය | | 5 සි | 6 වි | ය |
| ත් | | ර් | | 7 ය | ක් | ෂ | | ධා | |
| 8 ද | ර් | ශ | 9 න | | ක | | 10 අ | ය | 11 න |
| ය | | 12 ක | ඩ | | 13 ල | 14 ලී | ත | ක | ලා |
| | 15 බ | | 16 ය | 17 ච | | ත | | | ච |
| 18 කා | ල | ය | | 19 ග | ම | | | 20 අ | |
| | ය | | 21 සූ | කී | | 22 ස | මා | ධි | |
| 23 බා | බෙ | ල් | | 24 ම | 25 ස | ත් | | 26 ක | ය |
| | දී | | 27 අ | | 28 ත | න | 29 තු | ර | |
| 30 ස් | ම | ර | ණ | ය | | 31 ස | ර | ණ | ය |

## ආදරණීය දරුවනී

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සණ නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි ආදිය ලැබීමට
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමඟ
පන්තිභාර ගුරුතුමාගේ හෝ
ගුරුතුමියගේ
අත්සන ඇතිව අප වෙත එවන්න.

**සංස්කාරක පියතුමා,**
**"භක්ති ප්‍රබෝධනය",**
**265, ඕීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email:bhakthi.prabodhanaya@gmail.com

## ප්‍රහේලිකා අංක 80 ජයග්‍රාහකයා

දයාබර දරු දැරියනී,

ප්‍රහේලිකා අංක 80 සම්පූර්ණ කර අප වෙත එවූ සැමටම ස්තුති කරමු. නිවැරදි පිළිතුරු එවූ දරු දැරියන් අතුරින් පහත නම් සඳහන් දරුවෝ ජයග්‍රහණය කළහ. සහභාගී වූ සියල්ලන්ටම සුබ පතන අතර ත්‍යාග ලාභීන් වෙත ත්‍යාගය යථා කාලයේදී පාසැලේ විදුහල්පතිතුමා හෝ විදුහල්පතිතුමිය මගින් ලැබෙන බව කරුණාවෙන් සලකන්න.

**නිවැරදි පිළිතුර එවා ජයග්‍රහණය කළ දරුවෝ**

- **පළමු ස්ථානය** - යෙනුලි ෂෙනායා ජයමාන්න, 9 ශ්‍රේණිය, යහපත් එඬේරාගේ කන්‍යාරාමය, කොටහේන.
- **දෙවන ස්ථානය** - සදිල් අනුහස්, 7 ශ්‍රේණිය, ක්‍රිස්තුරාජ ජාතික පාසැල, තුඩැල්ල, ජා-ඇල.
- **තෙවන ස්ථානය** - ජී. ඒ. ඩී. මිනුලි නෙසත්මා, 8 ශ්‍රේණිය, ද මැසනොද් විද්‍යාලය, කඳාන.

## භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමා

**2025 ජනවාරි / පෙබරවාරි - "ආගම යනු ....."**
(ජනවාරි පෙබරවාරි කලාපය සඳහා ඔබ එවන ලිපි නොවැම්බර් 15 ට පෙර අප වෙත එවන්න.)
**2025 මාර්තු / අප්‍රේල් - "විමුක්තිය"**
(මාර්තු අප්‍රේල් කලාපය සඳහා ඔබ එවන ලිපි ජනවාරි 15 ට පෙර අප වෙත එවන්න.)

# කතෝලික ධර්මය
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - I වන කොටස
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. විශ්වාසය, බලාපොරොත්තුව හා ප්‍රේමය පදනම් වන්නේ කීවෙනි පනත තුළද ?
   1) දෙවන පණත 2) තුන්වන පණත 3) පළමු පණත 4) හයවන පණත
2. අපගේ යැදුම් තුළින් දෙවියන් වහන්සේ වෙත ඔසවනු ලබන්නේ කුමක් ද ?
   1) අපගේ දෑත් 2) අපගේ හදවත් 3) අපගේ නෙත් 4) අපගේ දෙපය
3. සහෝදර ප්‍රේමය හා බද්ධ නොවූ පඬුර ප්‍රතික්ෂේප කරන ලද්දේ මින් කවුරුන් ද ?
   1) ගෝලයන් 2) රජවරු 3) පූජකයන් 4) දිව්‍යසිවරු
4. එකම සම්පූර්ණ යාගය වන්නේ කවුරුන් විසින් පුදන ලද යාගයද ?
   1) ක්‍රිස්තුන් වහන්සේ විසින් පුදන ලද යාගය 2) මෙල්කිසදෙක්ගේ යාගය
   3) ආබ්‍රහම් තුමා පුදන ලද යාගය 4) ඊසාක් විසින් පුදන ලද යාගය
5. සක්‍රමේන්තු ලබා ගැනීමේදී පොරොන්දු දෙන සක්‍රමේන්තු අයත් පිළිතුර තෝරන්න.
   1) ප්‍රසාද ස්නාපනය/රෝගීන්ගේ ආලේපය 2) පූජකවරය/අභිවෘද්ධි ආලේපය
   3) පූජකවරය/දිව්‍ය සත්ප්‍රසාදය 4) ආශීර්වාදකාර බන්ධනය /පාපෝච්චාරණය
6. ශුද්ධවූ පාවුලු තුමා විසින් දරුවන්ට හා දෙමාපියන්ට අවවාදකර ලියන ලද ලිපිය
   1) එපීස ලිපිය 2) කොරෙන්ති ලිපිය 3) රෝම ලිපිය 4) ගලාති ලිපිය
7. "දරුවනි සියලු කාරණාවලදී, දෙමාපියන්ට කීකරු වන්න. මන්ද ඔබ එසේ කිරීම සමිඳාණන් වහන්සේටද ප්‍රීතියකි". මෙම වාක්‍යය සඳහන් වන්නේ කවර ලිපියේ ද ?
   1) කොරෙන්ති 2) එපීස 3) කොලොස්සි 4) 2 තෙසලෝනි
8. "ඔබ අතර යමෙක් ප්‍රධානයා වන්න කැමැත්තේ නම් ඔහු ඔබේ දාසයා වන්නේ" මෙම කොටස සඳහන් වන සුවිශේෂය තෝරන්න.
   1) ලූක් 2) මාක් 3) ජොහාන් 4) මතෙව්
9. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ නව අර්ථ කථනයක් දෙන ලද්දේ කීවෙනි පණතට ද ?
   1) තුන්වන පනතට 2) හතර වන පනතට 3) අටවන පනතට 4) පස්වන පනතට
10. කායින් හා ආබෙල් සිද්ධියට අදාළ නිවැරදි වාක්‍ය ඛණ්ඩය තෝරන්න.
   1) නුඹේ සහෝදරයාගේ ලේ අහසෙන් මට හඬගසයි. 2) නුඹේ සහෝදරයා නුඹට ආදරය කරයි.
   3) නුඹේ සහෝදරයාගේ ලේ පොළොවෙන් මට මොරගසයි. 4) නුඹේ හඬට සමාන හඬක් මට මොරගසයි.
11. පියතුමෙකු විසින් පාපෝච්චාරණය ඇසීමේදී සමාව දීමට රදගුරුතුමකුගෙන් අවසර ගත යුත්තේ කුමන පාපයන් සඳහා ද ?
   1) සහෝදරයා සමග අමනාපවීමේ වරදට 2) ගබ්සාව
   3) අන් අයගේ වස්තුව සොරා ගැනීමේ වරදට 4) කාමයේ වැරදි ලෙස හැසිරීමේ වරදට

12. "මරණයට පත් වූවත් මම මගේ දේව ජීවිතය නැති කර ගන්නේ නෑ" මේ වාක්‍යය හා සම්බන්ධ තැනැත්තා කව්ද ?
   1) ශු. මරිය ගොරෙත්ති තුමිය 2) ශු. කතරිනා තුමිය 3) ශු. එලිසබෙත් තුමිය
   4) ශු. තෙරේසා මව්තුමිය

13. සංරක්ෂණය කිරීම, රැක බලා ගැනීම යන අදහස දෙන හෙබ්‍රව් වචනය සොයන්න.
   1) අබාද් 2) ෂාමාර් 3) රාදා 4) ෂාලොම්

14. කිතුනු දයාවට පටහැනි ක්‍රියාවන් මොනවා ද?
   1) ඊර්ෂ්‍යාව/ආදරය 2) පලිගැනීම/ප්‍රේමය 3) වෛරය/පලිගැනීම 4) ප්‍රේමය/ආදරය

15. සභා නීති සංග්‍රහය තුළ ඇතුළත් වන්නේ කුමක්ද ?
   1) ශුද්ධවූ සභා විනය හා සෙසු කාරණා පිළිබඳ නීතිය 2) පවුල් නීතිය
   3) සමාජය පිළිබඳ නීතිය 4) ශුද්ධවන්තයන් පිළිබඳ නීතිය

16. එක්වරු ශීලය රැකීමේ ප්‍රධාන පරමාර්ථය කුමක්ද ?
   1) ආහාර නොගෙන සිටීම 2) අනෙක් අය කරන නිසා කිරීම 3) ආහාර ගෙදර නොතිබීම
   4) දන්දීම

17. එක්වරු ශීලය රැකීමේ ශික්ෂා පදයෙන් නිදහස් වන්නේ කවුරුන් ද ?
   1) රෝගී අය සහ තරුණ අය 2) වයස්ගත වූවන් හා රෝගී අය
   3) මැදවියේ අය හා වයස්ගත වූවන් 4) මේ සියලුම දෙනා

18. ඇතුළාන්ත සාමයට මූලික වන කරුණ ඇතුළත් පිළිතුර
   1) සත්‍යය, යුක්තිය, ප්‍රේමය 2) ප්‍රේමය, නිදහස, දැනුම 3) යුක්තිය, නිදහස, ප්‍රඥාව
   4) ප්‍රඥාව, දැනුම, සත්‍යය

19. ක්‍රිස්තුන් වහන්සේ යාග වූයේ ඇයි ?
   1) තමන්ගේ බලය පෙන්වීමට. 2) දෙවියන් වහන්සේ තමනට ආදරය නැති බව පෙන්වීමට.
   3) මිනිසා පාපයෙන් ගලවා ගැනීමට. 4) මෝසෙස්තුමාගේ ව්‍යවස්ථාව ස්ථිර කිරීමට.

20. "සබත් දවස ශුද්ධ ලෙස පැවැත්වීමට හිතට ගන්න" මෙය සඳහන් වන පොත වන්නේ.
   1) උප්පත්ති 2) ද්විතීය නීති සංග්‍රහය 3) රාජාවලිය 4) නික්මයාම

පිළිතුරු

(1). 3 (2). 2 (3). 4 (4). 1 (5). 2 (6). 1 (7). 3 ( 8). 4 ( 9). 4 (10). 3
(11). 2 (12). 1 (13). 2 (14). 3 (15). 1 (16). 4 (17). 2 (18). 1 (19). 3 (20). 4

**ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය.**
විදුහල්පතිනිය - මිනු/ පහළ මඩම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලය - කටාන.

# නව ගිවිසුම හා සුබාරංචි ලේඛන ගතවීම VI

## අ.පො.ස. (උ.පෙළ) ක්‍රිස්තියානි ධර්මය/ශිෂ්ටාචාරය සඳහා අත්වැලක්

## සුභාරංචිය යනු කුමක්ද ?

ක්‍රිස්තුස් වහන්සේ තම ප්‍රසිද්ධ ජීවිතයේදී ලියන ලදැයි සැලකෙන කිසිදු ලේඛනයක් සොයා ගත නොහැකිය. එහෙත් උන්වහන්සේගේ ඉගැන්වීම් ඇතැම් පුද්ගලයන් තම මතකයේ තබාගත් අතර ඇතැම් සිදුවීම් තමන් භාවිත කළ යම් යම් පත්‍රිකාවල ලියන්නට ඇත. ඒවා ක්‍රිස්තු පුවත්, හෙවත් මූලාශ්‍ර (Q) ලෙස හැඳින්වේ. මේ ලිපියෙන් බලාපොරොත්තු වන්නේ ඒ සුබාරංචිය ගොඩනැගුණු අදියරයන් පිළිබඳව කථා කිරීමය.

<u>සුබාරංචිය යනු කුමක්ද ?</u>

එය තම සවනට දැනෙන ඇහෙන යහපත් පණිවුඩයකි. ඒ සඳහා යෙදෙන හෙබ්‍රෙව් පදය 'බසාර්' (Basar) යන්නය. එනම් යහපත් ආරංචියක් පැවසීමයි. රජ තුමකු යුද්ධයට ගොස් ජයග්‍රහණය ලැබූ බව තම රටවැසියාට පැවසීමයි. රජ තුමෙකු යුද්ධයට ගොස් ජයග්‍රහණය ලැබූ බව තම රටවැසියාට පැවසීම යහපත් ආරංචියකි. ඉන් පෙන්වා දෙන්නේ දෙවි සමිඳාණන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාව වෙත දක්වන ආදරය කරුණාව හේතුවෙන් ජයග්‍රහණ අත්පත් කරගන්නා බවයි. 2 සැමුවෙල් 4/10 පැරණි ගිවිසුමේ "බසාර්" යන පදය භාවිත වූයේ යුද්ධ ජයග්‍රහණයන් පැවසීම වෙනුවෙනි.

පසුකාලයේදී දෙවියන්වහන්සේ ඉශ්‍රායල් ජනතාව කෙරෙහි මැදිහත් වීම ආගමික මුහුණුවරකින් පෙන්වීම සුබාරංචිය ලෙස හඳුනා ගත හැකිය. ඒ සඳහා යෙදූ හෙබ්‍රෙව් පදය " බසෝරා" (Besorah) එහි අර්ථය දෙවිඳුන් කෙරෙන් ලැබෙන ගැලවීමේ සුබ පණිවුඩයකි. එහෙත් යෙසායා දිවැසිවරයා පෙන්වා දෙන්නේ සුබාරංචිය යන්න දිළිඳුන්, බිඳුණු සිත් ඇති අය, වහලුන් හා සිරකාරයන් වැනි අයටද ගැලවීම හිමි වන බවකි. නව ගිවිසුම් සමයේ සුබාරංචිය ලෙස පෙන්වා දිය හැක්කේ අධිරාජයා ගේ උපත හෝ සිහසුන් ප්‍රාප්ත වීමයි.

ග්‍රීක් බසට පරිවර්තනය වූ සෙප්ටුවාජින්ත ශුද්ධ ලියවිලි පරිවර්තනයේ සුබාරංචිය යන්න යෙදී ඇති ග්‍රීක පදය 'එව්අංගේලියොන්' ලෙස හැඳින්වේ. එහි අර්ථය යුද්ධ ජයග්‍රහණය හෝ නව රජකෙනකු පත්ව ඇති බව දැනුම් දීමයි. ඉංග්‍රීසි බසින් 'ගෝඩ්ස්පෙල්' God-speel පසුව ඒ වදන එක්වී ගොස්පල් (Gospel) යන පදය සුබාරංචියට යොදා ඇත.

නව ගිවිසුමේ ක්‍රිස්තුස් වහන්සේගේ මාංසගතවීම සුබාරංචිය ලෙස පෙන්වා දිය හැකිය. එසේ නම් ශුභාරංචිය වන්නේ ක්‍රිස්තුස් වහන්සේය. ඒ අනුව සුබාරංචියේ අන්තර්ගතය කරුණු 6 කි.

1. මාංසගතවූ දේව පුත්‍රයාගේ ජීවිත කථාව.
2. උන්වහන්සේ ජනතාවට දුන් පණිවුඩය.
3. ගලීලයේ හා ජෙරුසලම අවට ප්‍රදේශවල සේවාව.
4. මනුෂ්‍ය පුත්‍රයාගේ දුක්විඳීම.
5. උන්වහන්සේගේ කුරුසිය මත සිදුවූ ශ්‍රී මරණය.
6. ක්‍රිස්තුස් වහන්සේගේ පුනර්ජීවනය හෙවත් උත්ථාන වීම.

<u>සුබාරංචිය ලේඛනගතවීමේ අවධි</u>

ක්‍රිස්තුස් වහන්සේගේ සුබාරංචිය ලේඛන ගතවූ ක්‍රම 3 කි.

1. ක්‍රිස්තුස් වහන්සේගේ දූත මෙහෙවර හා පාස්කු අභිරහස සුබාරංචිවල කේන්ද්‍රය වී ඇත. (අප අතර සිදුවී ඇති සිදුවීම් ඇසූ දුටු අය)
2 කේන්ද්‍රය වටා ගොඩනගා ඇති ක්‍රිස්තුස් වහනසේගේ වචන හා ක්‍රියා (සවන්දුන් අය)
3. ක්‍රිස්තුස් වහන්සේගේ වචන හා ක්‍රියා පරිසරයේ අවශ්‍යතා අනුව ගලපා ඇති අය (සුබාරංචිය දේශනා කළ අය)

ශුද්ධ ලියවිල්ල විනයධරයන් මෙන්ම රබ්බිවරුන් විසින් කටපාඩම් කිරීමෙන් මතක තබා ගන්නා ලදි. එලෙස සුබාරංචියද කටපාඩම් කිරීමෙන් මතක තබා ගැනීමට ශ්‍රාවකයන් තම

අනුගාමිකයන්ව යොමුකර ඇත. ඒ බලාපොරොත්තු වූයේ සුබාරංචිය දෙසීමට, එය ඉගැන්වීම, නමස්කාරය සඳහා එය යොදා ගැනීම පිණිස සිදු කිරීමය. ක්‍රිස්තුස් වහන්සේගේ මරණයෙන් පසුව උන්වහන්සේගේ ශ්‍රාවකයෝ බියෙන් එහෙත් යාච්ඤාවෙන් ජෙරුසලමට වී සිටි අතර ශුද්ධාත්ම දානයෙන් පසුව ඔවුන් බලවත් වූහ. එහිදී ක්‍රිස්තුස් වහන්සේගේ දූත සේවාව ඉදිරියට පවත්වාගෙන යාමට ශ්‍රාවකයන්ට සිදුවිය. ඒ සඳහා ශුද්ධාත්ම බලයද ඔවුන්ට ලැබුණි. ක්‍රිස්තුස් වහන්සේ තම දූත සේවාව පවත්වාගෙන යාමට ශ්‍රාවකයන්ට වගකීම් පැවරූහ. ඒ දූත සේවාව යනු සබාරංචියයි.

<u>වාචික සම්ප්‍රදාය බිහිවීම</u>

උන්වහන්සේගේ සුබ වදන් ඉදිරියට පවත්වාගෙන යාම සිදුවූයේ වාචික සම්ප්‍රදායෙනි. සුබාරංචිය ග්‍රන්ථ ආශ්‍රයෙන් බිහිවී නොතිබුණි. වසර 50 ක පමණ කාලයක් කටින් කට සුබාරංචිය බෙදා ගනීමට යාමේ දී වාචික සම්ප්‍රදාය අභියෝග යට ලක්විය. වාචික සම්ප්‍රදායෙන් පෙන්වා දුන් විශේෂ ලක්ෂණ 2 කි.

1. ජනතාව පාපයෙන් මුදවා ලීමට පැමිණි මෙසියස් වහන්සේ, ක්‍රිස්තුස් වහන්සේ බව තහවුරු කිරීම.
2. උන්වහන්සේ කේන්ද්‍ර කොටගත් දේව වන්දනා පිළිවෙත් සභාව තුළ වර්ධනය කිරීම.

වාචික සම්ප්‍රදායෙන් බිහිවූ සුබාරංචිය ඒ අයුරින් පවත්වා ගෙන යාමට නොහැකි විය. ඒ සඳහා බල පෑ හේතු කීපයකි.

1. ශුද්ධවූ සභාව වේගයෙන් ව්‍යාප්ත වීම හේතුවෙන් වාචික සම්ප්‍රදාය ඒ සඳහා ප්‍රමාණවත් නොවීම.
2. වාචික සම්ප්‍රදායේ ඇතැම් කතා පුවත් කාලයත් සමග අමතක වී යාම සහ සුබාරංචියට අයත් නොවන කරුණු ඇතුළු වීම වැළැක්වීම.
3. එම සිදුවීම් සමග බද්ධ වූ ශ්‍රාවක පිරිස මිය යාම.
4. මූලික සත්‍යතා නොවෙනස්ව පවත්වාගෙන යාමේ අභියෝග.
5. ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් සමග මිථ්‍යා මත ප්‍රකාශවීම වළක්වා ගත යුතු වීම.

යනාදි හේතුවෙන් සුබාරංචි ග්‍රන්ථ බිහිවීමට මග පෑදිණි. ඒ නිසා වාචික සම්ප්‍රදායේ පැවති සුබාරංචිය ලේඛන ගතවීම අරම්භ විය. ඒ පොත් සම්පාදනයේදී තොරතුරු රැස්කරගෙන ඇත්තේ කාලවකවානු 3 ක් උපයෝගී කරගනිමිනි.

1. පළමු අදියර ක්‍රි.ව. 0 - 33 දක්වා

මේ අදියර ක්‍රිස්තුස් වහන්සේගේ උපත, ළමා කාලය හා ප්‍රසිද්ධ ජීවිතය සම්බන්ධ දූත සේවාව පිළිබඳවත් තොරතුරු ඇතුළත් වී ඇත.

2. දෙවන අදියර ක්‍රි.ව. 33 - 50 දක්වා

උන්වහන්සේ ස්වර්ගාරෝහණය වීමෙන් පසුව අපෝස්තලුවරුන් සහ අනුගාමිකයන් ඒ වෙනුවෙන් සාක්ෂි දැරූ ආකාරය. ඔවුන් ඇසූ දුටු දේ, ප්‍රාතිහාර්ය, ශ්‍රාවකයන්ගේ දේශනා, ඉගැන්වීම් යනාදි කරුණු එම කොටස්ට ඇතුළත් වේ.

3. තෙවන අදියර ක්‍රි.ව. 50 - 70 දක්වා

ක්‍රි.ව. 50 සිට 70 දක්වා සුබාරංචි පැවති වාචික සම්ප්‍රදාය තුළ අපෝස්තලුවරුනගේ දේශනා ඇතුළත් විය. ඔවුන් ක්‍රමයෙන් මිය යාමෙන් අනතුරුව සුබාරංචි ලේඛන ගතවීම ආරම්භ විය. එය වාචික සම්ප්‍රදායේ කරුණු ලෙඛනගත වීම තුළ සම්පූර්ණත්වයට පත්විමකි. ඒ ඒ සුබාරංචි කතුවරුන් තමන්ට විශේෂ භාෂා ශෛලි භාවිත කරමින් සුභාරංචි රචනා කර ඇත.

සටහන **ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා**



# භක්ති ප්‍රබෝධනය 125 වන ජුබිලි සාංවත්සරික දිව්‍ය පූජා යාගය සහ උත්සවයේ සේයා සටහන්...



























# කුරුණෑගල ජෝසප් වාස්


## උසස් අධ්‍යාපන ආයතනය මගින් මෙහෙයවනු ලබන

# ද්විමාසික පූර්ණ ඉංග්‍රීසි නේවාසික පාඨමාලාව

ව්‍යාකරණ, කථනය, භාෂා උච්චාරණය, ලිවීම, සවන්දීම පිළිබඳව ප්‍රමාණවත් දැනුම් සම්භාරයකින් සිසු සිසුවියන් සන්නද්ධ කරවන ද්වි මාසික පූර්ණ ඉංග්‍රීසි පාඨමාලාව

**සදාචාරාත්මක පැවතුම් සහ යහපත් ආකල්පයන්ගෙන් සිසු සිසුවියන්ගේ ජීවිත හැඩගැන්වීම සඳහා:**

- භාවාත්මක ඥානය විකාශ කරවීම (Emotional Intelligence)
- නායකත්ව පුහුණුව (Leadership Training)
- සමාජ චාරිත්‍ර විධි පිළිබඳව අවබෝධය (Social Etiquttes)
- උපදේශණය (Counselling)
- ජීවිත ආරක්ෂණය (Life Saving)
- කෘෂිකාර්මික පුහුණුව (Agriculture Training)




**පාඨමාලා ආරම්භය:**
**2025-01-05**
**පන්නල** IHFC
**මධ්‍යස්ථානයේදී**



**අප ආයතනයේ හැදෑරිය හැකි වෙනත් පාඨමාලාවන්:**

- Pearson HND in Business Management
- Pearson HND in Computing
- Top-Up Degree in Business Management and IT
- AQUINAS Diploma in English (Level 1 to Final)
- Diploma in Teacher Training
- TEFL (Teaching English as a Foreign Language)

විමසීම්: Very Rev. Fr. Sagara Prishantha Perera - Director | 071 20 300 77 | www.jvi.lk | info@jvi.lk

Affiliated Study Center of: IDM Pearson UNIVERSITY OF GLOUCESTERSHIRE TVEC Registration: P12/0226

මිල රු.100/=
(සහන මිල)

"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමන් විසින් කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී. පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. DOP/NEWS/01/2024